# අලුත්තාලේ පුංචි ඡන්දේ

නව පළාත් පාලන ඡන්ද විමසීම පිළිබඳ හැඳින්වීමක්




Kingdom of the Netherlands

PAFFREL

# අලුත්තාලේ පුංචි ඡන්දේ

**නව පළාත් පාලන ඡන්ද විමසීම පිළිබඳ හැඳින්වීමක්**

# අලුත්තාලේ පුංචි ඡන්දේ

## නව පළාත් පාලන මැතිවරණය පිළිබඳ හැඳින්වීමක්

සම්පාදනය

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

LL.B(Colombo),MA(Mass Communication-Kelaniya)

පැෆ්රල් ප්‍රකාශන

12/3, රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත,

කොළඹ 06.

දුරකථන - 011 2514441|2

ෆැක්ස් - 011 2514443

ඊමේල් - paffrel@sltnet.lk

වෙබ් අඩවිය - www.paffrel.lk

ප්‍රථම මුද්‍රණය - 2018
දෙවන මුද්‍රණය - 2023

පැෆ්රල් ප්‍රකාශන වෙනුවෙන් සම්පාදනය-
නීතිඥ ජගත් ලියන ආරච්චි

ISBN 978-955-4082-03-8

පිටකවර හා පිටු සැකැස්ම-
පැෆ්රල් මාධ්‍ය අංශය

මුද්‍රණය-

....................

# පෙර වදන

පළාත් පාලනයේ ඉතිහාසය විජය රජුගේ ලංකාවතරණයෙන් පසු අනුරාධග්‍රාම, දීඝවාපීගාම, උරුවිලගාම, රෝහණගාම, වැනි ආර්ය ජනාවාස ඇති වීම දක්වා ඈතට ගියද, පසුව බ්‍රිතාන්‍ය ජාතික පාලනයත් සමග පළාත් පාලන ක්‍රම ව්‍යුහය සකස් විය. මධ්‍ය කාලීන මතකයන් අතර වසර 40 කට පමණ පෙර යම් යම් අවස්ථා වලදී මිනිසුන් භාවිත කළ ප්‍රසිද්ධ වචනයක් බවට මැම්බර් මහත්තයා එසේ නැතහොත් නැම්බර් මහත්තයා යන වචනය සමාජගත වී තිබුනි. තමන්ගේ කොට්ඨාසයේ නියෝජිතයා ඔවුන් හැඳින්වූයේ ඒ ආකාරයෙනි. එය සැබවින්ම ඉංග්‍රසි භාෂාවෙන් “Member” හෙවත් සාමාජිකයා යන්නට ග්‍රාමීය ජනතාව ලබාදුන් උච්චාරනය විය.

පසුව ගම්සභා ක්‍රමය වෙනුවට ප්‍රාදේශිය සභා, නගර සභා, මහ නගර සභා වශයෙන් සිදුවූ වෙනස්කම් තුළ ප්‍රාදේශිය සභා නියෝජිතයා භාවිතයෙන් ජනතාව අතර ප්‍රාදේශිය සභා මන්ත්‍රී නම් විය. එහෙත් ඔහු සැබවින්ම මහජනයාගේ නියෝජිතයාය. මෙම ක්‍රමය තුළ ප්‍රාදේශිය සභා, නගර සභා, මහ නගර සභා බල ප්‍රදේශයටම වගකියන්නෙක් වූ අතර තමන්ගේ කොට්ඨාසයට වගකියන්නෙක් යන වගකීමෙන් මිදුනි. මනාප ලබා ගැනීමේ ක්‍රියාවලියේ යෙදෙමින් නියෝජිතයෙකු වූ ඔහු කුඩා ප්‍රදේශයකට නොව සමස්ථ බල ප්‍රදේශයටම නියෝජිතයෙක් හෝ නියෝජනය කළ යුත්තෙක් බවට පත් විය. එහි ප්‍රතිපලයක් ලෙස ගමට නියෝජිතයෙක් අහිමි වී මනාප ක්‍රමයෙන් තේරීපත් වූ නියෝජිතයෙකු නිර්මාණය විය. එහි හොඳ නරක වසර 40 කට නොඅඩු කාලයක් තුළ ඔබ අප අත්විඳිමින් සිටී.

මෙම තත්වයන් තුළ ශ්‍රී ලංකීය ප්‍රජාව සුවිශේෂකොට ගත් සිවිල් සංවිධාන සහ විද්වතුන් මෙම ක්‍රමයේ හොඳ නරක අත්දකිමින් සමාජයේ ඇති කල පුළුල් කතිකාවත නව පළාත් පාලන ක්‍රමයකට මග පාදා ඇත. ඒ අනුව අප මේ වන විට නව පළාත් පාලන ඡන්ද විමසීමකට මුහුණු දෙමින් සිටින්නෙමු. මෙම නව ක්‍රමය තුළ කොට්ඨාසයට නිශ්චිතවම නියෝජිතයෙකු ලැබෙනවා මෙන්ම ගමට වගකියන නියෝජිතයෙක් ලැබීම නව පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ යහපත් ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක. එසේම කාන්තා නියෝජනයට අවස්ථාවක් ලැබීමත් ඒ සඳහා අත්‍යාවශ්‍ය නීතිමය අයිතියක් ලැබීමත් මෙම ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණයකි.

ගමට වගකියන නියෝජිතයෙකුගේ අවශ්‍යතාවය සම්පූර්ණ වීමත්, එම නියෝජිතයා ගමට වගකිව යුතු වීමත්, ඔහුට ලැබෙන සෑම ඡන්දයකටම වටිනාකමක් එක් කළ යුතු අයෙකු වීමත්, මනාප ලබාගැනීමේ තරඟය තුළ සමාජයේ ඇති වන අනර්තකාරී තත්වයත් මෙමගින් මගහැරෙන බව අප විශ්වාස කරන්නෙමු.

එමෙන්ම යහපත් නියෝජිතයෙකු තෝරා ගැනීම සඳහා ඡන්දදායකයා දැනුම්වත් කිරීමත් සවිඥානික කිරීමත් කළ යුතු කාර්යක් වශයෙන් අප විශ්වාස කරන අතර ඒ සඳහා නිරන්තරයෙන් තොරතුරු හා දැනුම ඡන්දදායකයාට ලබාදීම පැෆ්රල් වගකීමක් ලෙස විශ්වාස කරන්නෙමු.

මෙම අරමුණ පෙරදැරි කර ගනිමින් නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය සහ සුදුසු නියේජිතයෙකු තෝරා ගැනීමට මග පෙන්වන "අලුත් තාලේ පුංචි ඡන්දය" නම් මෙම පොත ඔබට පිළිගන්වන්නෙමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

# අලුත්තාලේ පුංචි ඡන්දේ
## නව පළාත් පාලන ඡන්ද විමසීම පිළිබඳ හැඳින්වීමක්

පෙළගැස්ම | පිටු අංක


| | | |
|---|---|---|
| 1. | පළාත් පාලනයේ සහ පලාත් පාලන ඡන්ද විමසීමේ විකාශනය | 01 - 04 |
| 2. | ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන හා මහජන නියෝජිතයෝ | 05 - 06 |
| 3. | නව පළාත් පාලන ආයතන මැතිවරණ ක්‍රමයේ විශේෂතා | 07 - 10 |
| 4. | ඡන්ද විමසීම මගින් සභිකයින් තෝරා ගන්නා ක්‍රමය | 11 - 12 |
| 5. | පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම | 13 - 17 |
| 6. | මැතිවරණ ප්‍රචාරණය | 18 - 22 |
| 7. | ඡන්ද දිනය හා ඡන්දය ප්‍රකාශ කිරීම | 23 - 27 |
| 8. | ඡන්දය ගණන් කිරීම | 28 - 29 |
| 9. | පළාත් පාලන ආයතනය පිහිටුවීම | 30 - 31 |
| 10. | පළාත් පාලන ඡන්ද විමසීමට අදාල වැරදි හා දූෂණ | 32 - 36 |
| 11. | පළාත් පාලන සභිකයකුගේ කාර්යභාරය | 37 - 40 |
| 12. | මහජන නියෝජිතයකු තෝරාගැනීම පිළිබඳ උපමාන | 41 - 43 |

# 01.

# පළාත් පාලනයේ සහ පලාත් පාලන ඡන්ද විමසීමේ විකාශනය ලංකාවේ පළාත් පාලන ආයතන විකාශනය

## පැරණි රජසමය

ලංකාවට පළාත් පාලන පිළිබඳ දිර්ගකාලීන අත්දැකීමක් හා භාවිතයක් ඇතිබව අපගේ ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. හතරවන සියවසේ පමණ සිට නගර පාලනය සඳහා නගර ගුත්තික නමින් ධුරයක් තිබුන බව මහාවංශය සාක්ෂි දරයි. එමෙන්ම ග්‍රාමීය මට්ටමින් ගමේ නායකයන් විසින් පවත්වාගෙන ගිය ගම්සභා ක්‍රමයක් පැවතිනි ගමෙහි පාලන කටයුතු මෙන්ම ආරවුල් නිරාකරණය හා සුළු අපරාධ පිළිබඳ නඩු විසදීම හා දඩුවම් කිරීමද මෙම ගම් සභාව මගින් සිදුකරන ලදී.

විශේෂයෙන්ම ගොවිතැන මූලික කරගත් සමාජයේ ඒ හා බැදුනු බොහෝ පරිපාලන කටයුතු මෙම ගම් සභාව විසින් සිදු කරන ලද අතර විශේෂයෙන්ම ආහාර සුරක්ෂිතාව පිළිබඳ විශේෂ අවධානයක් ගම්සභාව යොමුකරන ලදී. මේ සඳහා බලයට පත්වුයේ මහජන නියෝජිතයින් නොව පාරම්පරික කුලවතුන්ය. එය බොහෝවිට පරම්පරාවෙන් උරුම වු ධුරයක් විය. ඒවා මහරජුගේ පාලනයෙන් බොහෝ දුරස්වු ස්වයංපාලන ඒකක විය.

## බ්‍රිතාන්‍ය සමය 1818 - 1948

ඉතා පැරණි ඉතිහාසත් හිමි මෙන්ම ක්‍රමයෙන් වර්ධනය මෙමින් පැවති ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය 1818 මාර්තු මස අත්සන් කරන ලද කන්ද උඩරට ගිවිසුමත් සමගම අහෝසිවිය ඒ අනුව පළාත් පාලන කටයුතු සඳහා ස්වදේශියන්ට මැදින් විය නොහැකි විය.

## 1856

සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා ගේ සමයේදී 1956 අංක 9 දරණ වාරිමාර්ග ආඥා පනත පැනවු අතර ඒ මගින් කෘෂිකර්මය යලි පනගැන්වීම හා වාරිමාර්ග කටයුතු නඩත්තුව හා අධීක්ෂණය සඳහා ගම් සභා පිහිටුවිය එය පෙර රජ දවස පැවති ගම් සභා මෙන් නොව නීතිමය බලයක් සහිත පළාත් පාලන ඒකක විය.

## 1965

1965 අංක 17 දරණ මහනගර සභා පනත යටතේ 1965 දී කොළඹ හා මහනුවර නගර සභාද 1886 දී ගාල්ල නගර සභාවද පිහිටු වීය.

**1871**
රෝබින්සන් ආණ්ඩුකාර වරයා විසින් ග්‍රාම ප්‍රජා පිළිබඳ ආඥා පනත (Village Community Ordinance) ගෙන ඒමත් සමග ගම් සභා නැවත ව්‍යවස්ථාගත කරන ලදි. මේවා මුලින් ග්‍රාම කමිටු ලෙසද පසුව ගම්කාර්ය සභා ලෙසද හැඳින්විනි. අදාල ප්‍රදේශයේ ගම්වාසින් 10 දෙනකුගේ ඉල්ලීම් මත ආණ්ඩුකාර වරයා හා පාර්ලිමේන්තුව (ව්‍යවස්ථාදායකය) විසින් ග්‍රාම කමිටුවක් පත්කරන අතර එහි සභාපති වුයේ ඒජන්ත වරයාය. පරිපාලන කටයුතු වලට අවශ්‍යවන අරමුදල් නිරාකණය හා සුලු අපරාධ පිළිබඳ අධිකරන බලයද මෙම කමිටුවලට හිමිවිය. මේවා ගම්සභා උසාවි ලෙසද හැඳින්විනි.

**1884**
ග්‍රාම කමිටු ආඥා පනත කරන ලද සංශෝධනයක් අනුව ග්‍රාම කමිටුව සභාපති ලෙස ගම්මුලාදෑනියා නිළ බලයෙන් පත්විය.

**1892**
සුලුනගර සනීපාරක්ෂක ආඥාපනත (1992 අංක 18) යටතේ දිස්ත්‍රික්කයකට එක බැගින් සනීපාරක්ෂක මංඩල පිහිටුවල ලදී

**1898**
නිළ සාමාජිකයින් තුන් දෙනැකන් හා නිළ නොලත් සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් සමන්විත ප්‍රාදේශීය මංඩල පිහිටු වීම 1898 අංක 13 ප්‍රාදේශීය මංඩල ආඥා පනත (Local Board ordinance) මගින් සිදුවිය. මෙහිදී නිළලත් සාමාජිකයින් ලෙස සහකාර ඒජන්න මහජන වැඩ නිළධාරි හා වෛද්‍ය නිළධාරියා (සිවිල්) කටයුතු කර ඇත. නිළ නොලන් සාමාජිකයින් ලෙස රුපියල් 1000 කට වඩා වැඩි දේපලක් හිමි පෙර වැරදි නැති ප්‍රදේශවාසින් තිදෙනෙකු නිළ සාමාජිකයන්ගේ ඡන්දය පත්කරන ලදී. මේ යටත් එක් නගරයකට එක් ප්‍රාදේශීය මංඩලය බැගින් පිහිටුවන ලදී.

**1939**
1939 අංක 61 දරණ නගර සභා (Urban Council )පනත යටතේ තරමක් විශාල නගරවල නගර සභා පිහිටුවණ ලදි

**1946**
කුඩා නාගරික ප්‍රාදෙශ් වල 1946 අංක 3 දරණ සුළු නගර සභා (Town Council) පනත යටතේ සුළු නගර සභා පිහිටුවා ලදී.

## නිදහසින් පසු යුගය - 1948 සිට

**1980**
ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේ විශාල වෙනසක් සිදු කරමින් ගම්කාර්ය. සභා නගර සභා, සුලු නගර සභා විසුරුවා හැර ඒවා දිස්ත්‍රික් සංවර්ධන සභාවලට අනුයුත්ත උපකාර්යාල බව පත්කරන ලදි එමෙන්ම ග්‍රාමීය ප්‍රාදේශවල ග්‍රාමෝදය මංඩල පිහිටුවා පළාත් පාලන කටයුතුවලට අදාල සැලසුම් සකස් කරන ලදී.

## 1987

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා පිහිටුවීමත් සමගම පළාත් පාලනය විමධ්‍යගත විෂයක් ලෙස පළාත් සභාවලට පැවරිනි. පලාත්පාලන අමාත්‍යංශය නියාමනය හා ජාතික ප්‍රතිපත්ති සඳහා වෙන්විය. මේවන විට ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග 3ක් දන්න්න්නට ලැබේ.

1. මහනගර සභා
2. නගර සභා
3. ප්‍රාදේශිය සභා

## පලාත් පාලන ආයතන ඡන්ද විමසීම්

මුල් කාලයේ පලාත් පාලන ආයතන සඳහා සභිකයින් නිලබලයෙන් හා නම් කිරිමෙන් පත් වුවද පසුව එය අදාල බලප්‍රදේශයේ ප්‍රජාවගේ ඡන්දයෙන් තෝරපත් කරගැනීමක් දක්වා වර්ධනය විය.වර්ථමානයේ මේ සඳහා බලපාන නීතිය වනුයේ 262 වන අධිකාරය වු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතයි.

මෙහි මුල් පනත 1947 වසරේදී සම්මත කරන ලද අතර 2017 දෙසැම්බර් මාසය වන විට මෙම පනත සඳහා සංශෝධන 20ක් පමණ ගෙනවිත් ඇත. ඒ අනුව මේ වන විට පනතේ මුල් ස්වරූපය මුලුමනින්ම පාහේ වෙනස් වී ඇත. මේ අතරින් ඉතා වැදගත් සංශෝධන කිහිපයක් වන්නේ

## කොට්ඨාශ ක්‍රමයෙන් සමානුපාතික නියෝජනයට මාරුවීම

මුල් කාලීනව පලාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් පවත්වන ලද්දේ කොට්ඨාශ ක්‍රමයටය. ඒ අනුව කොට්ඨාශය සඳහා නියෝජිතයින් තෝරාගන්නා ක්‍රමයට 1977 දක්වාම පලාත් පාලන ඡන්ද විමසීම් පවත්වා තිබේ. ඒ අනුව අදාල කොට්ඨාශයේ පවතින ඡන්ද මධ්‍යස්ථානයේදීම ඡන්දය ගනන්කර ප්‍රතිඵලය නිකුත් කරනු ලැබේ. පාර්ලිමේන්තුවට සමානුපාතික නියෝජනය හඳුන්වාදීමත් සමග පලාත් පාලන ආයතන සඳහාද සමානුපාතික නියෝජන ක්‍රමය හදුන්වාදෙනු ලැබීය. ඒ අනුව 1979 වසරේ නගරසභා සහ මහනගර සභා සඳහා සමානුපාතික ක්‍රමය යටතේ පලමු වරට පවත්වනු ලැබීය.

## මනාප ක්‍රමය හඳුන්වාදීම

1979 වසරේදී පැවති පලාත් පාලන මැතිවරණය සමානුපාතික නියෝජනය අනුව පැවති ඡන්ද විමසීමක් වන අතර එහිදී මනාප ක්‍රමය භාවිතා නොවීය. මනාප ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පැවති ප්‍රථම පලාත් පාලන ආයතන ඡන්ද විමසීම වූයේ 1991 වසරේ මහනගර සභා නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා වූ ඡන්ද විමසීමයි. එසේම එය ප්‍රථම එක්දින පලාත් පාලන මැතිවරණය ලෙසද වාර්තා විය.

## තරුණ අපේක්ෂකයින් අනිවාර්ය කිරීම

තරුණ නියෝජනය අනෙකුත් මහජන නියෝජන ආයතනවල මෙන්ම පලාත් පාලන ආයතනවලද ඉතාමත් අඩු තත්වයක් දක්නට ලැබිණි. මේ හේතුවෙන් තරුණ ප්‍රජාව පලාත් පාලන ආයතනතුල නොසලකා හැරීමක් දක්නට ලැබිණි. 1990 වසරේදී පත් කරන ලද තරුණ අසහන කමිටුවේ නිර්දේශ පාදක කරගනිමින් පාලත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතට සංශෝධනයක් ගෙන එමින් සෑම පලාත් පාලන නාමයෝජනා ලැයිස්තුවකම 1/3ක් වයස අවුරුදු 40ට අඩු අපේක්ෂකයින්ගෙන් යුතුවිය යුතු බවට ප්‍රතිපාදන ඇතුලත් විය.

## මිශ්‍ර මැතිවරණ ක්‍රමය හඳුන්වා දීම

ඉහත දී සාකච්ඡා කරන ලද පරිදී මුල් කාලීන පලාත් පාලන ඡන්ද විමසීම් කොට්ඨාශ ක්‍රමයට පැවති අතර පසුව 1979 සිට සමානුපාතික නියෝජන ක්‍රමයට පවත්වන ලදී. මෙම ක්‍රම දෙකේ පවතින දුර්වලතාවයන් මගහරිමින් ධනාත්මක ලක්ෂණ ඉස්මතු වන පරිදී කොට්ඨාශ හා සමානුපාතික නියෝජනය යන ක්‍රම දෙකම මත පදනම්වූ මිශ්‍ර ඡන්ද විමසීම් ක්‍රමයක් 2012 වසරේදී හඳුන්වාදෙන ලදී. මුලින් කොට්ඨාශ ක්‍රමය යටතේ පලාත් පාලන නියෝජිතයින්ගෙන් 70% ක් ද ඉතිරි 30  සමානුපාතික නියෝජන ක්‍රමය යටතේද පත් වීමට නියමිත වූ අතර පසුව 2017 වසරේ සිදු කරන ලද සංශෝධනය මගින් මෙම අනුපාතය 60% හා 40% වශයෙන් සංශෝධනය කරන ලදී.

## අනිවාර්ය කාන්තා නියෝජනය හඳුන්වාදීම

ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති කිසිදු මැතිවරණයක කාන්තා නියෝජනය අනිවාර්ය වී නැත. ඒ සඳහා ප්‍රතිපාදන සැලසෙන්නේ පලාත් පාලන ඡන්ද විමසීම් පනතට 2017 වසරේ සිදුකරන ලද සංශෝධනයක් මගිනි. ඒ අනුව පලාත් පාලන ආයතනයක සභික සංඛ්‍යාවෙන් 1/4ක් කාන්තා නියෝජිතවරියන් ගෙන් සමන්විත විය යුතුය.

## පාළත් පාලන ආයතන ඡන්ද විමසීම මැතිවරණ දෙපාර්තමේන්තුවට භාරවීම

මුල්කාලීන පළාත් පාලන මැතිවරණ පවත්වන ලද්දේ පළාත් පාලන කොමසාරිස්වරයා විසිනි. නමුත් පසුව මෙම ඡන්ද විමසීම මැතිවරණ දෙපාර්තමේන්තුවට භාර වූ අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් පළාත් පාලන මැතිරවණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවට භාරවිය.

# 02.
# ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන හා මහජන නියෝජිතයෝ

## ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන

ඉහත පරිච්ඡේදවලින් විස්තර කල පරිදී විකාශනය වූ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ මේ වන විට පළාත් පාලන ආයතන වර්ග 3ක් දක්නට ලැබේ. එනම්

- මහනගර සභා - 24කි
- නගර සභා - 41කි
- ප්‍රාදේශීය සභා - 276කි

2018 ජනවාරි මාසය වන විට ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන සමස්ථ පළාත් පාලන ආයතන ප්‍රමාණය 341 කි.

## පළාත් පාලන ආයතයන් හි කොට්ඨාස

2012 වසරේදී පලාත් පාලන ඡන්ද විමසීම පනතට මෙන්ම මහ නගර සභා නගර සභා සහ ප්‍රාදේශීය සභා පනත් වලට සිදුකරන ලද සංශෝධනයන් මගින් සියලුම පලාත් පාලන ආයතන කොට්ඨාශ වලට බෙදා වෙන් කිරීමක් සිදු කරන ලදී. මෙම සෑම කොට්ඨාශයක් සදහාම මහජන නියෝජිතයකු පත් වන අතර සමහර ජනවාර්ගික විවිධත්වයක් සහිත කොට්ඨාශ සදහා නියෝජිතයින් දෙදෙනෙකු හෝ තිදෙනෙකු පත් කරනු ලැබේ.

## කොට්ඨාස සීමා නිර්ණය

පළාත් පාලන ආයතන තුල කොට්ඨාස සීමා නිර්ණය සිදු කිරීම සදහා බලය ඇත්තේ විෂයභාර අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන කොට්ඨාස සීමා නිර්ණය කමිටුවටය. මෙම කමිටුව පිළිබද ප්‍රතිපාදන 2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ දක්වා ඇත. එකී කමිටුව පළාත් පාලන ආයතනවල සීමා නිර්ණයන් සිදු කිරීමේදී පහත කරුණු සැලකිල්ලට ගතයුතුය.

- අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනවාර්ගික ජනගහන අනුපාතය සහ එම ජනවාර්ගික අනුපාතය මත පදනම් වන්නා වූ නියෝජනයක් සහතික කිරීමේ අවශ්‍යතාව.
- පළාත් පාලන ආයතනයේ භූගෝලීය ප්‍රදේශය සහ එහි භෞතික ලක්ෂණ.
- පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනගහනය සහ එහි ජන ඝනත්වය.
- පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන මට්ටම,

2012 වසරේදී සිදුකල සංශෝධනයට අනුව පාළාත් පාලන ආයතනවල කොට්ඨාශ සීමා නිර්ණය සිදු කිරීම සඳහා ජයලත් රවී දිසානායක මහතාගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් 2013 වසරේදී පත් කල අතර එකී කමිටුවේ වාර්තාව 2015 වසරේදී විෂයභාර අමාත්‍යතුමා විසින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා වෙත භාරදෙන ලදුව එතුමා විසින් එකී වාර්තාව පදනම් කරගනිමින් කොට්ඨාශ සීමාවන් පිළිබඳ ගැසට් පත්‍රය 2015 අගෝස්තු මස 21 වන දින නිකුත් කරන ලදී.

එම කොට්ඨාස සීමාවන් පිළිබඳව විශාල විරෝධයක් සමාජය තුළ පැන නැගුන බැවින් පනතේ ප්‍රතිපාදන අනුව යමින් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අශෝක පීරිස් මහතාගේ සභාපතීත්වයෙන් යුතු පළාත් පාලන ආයතන සීමා නිර්ණය පිළිබඳ සමාලෝචන කමිටුවක් පත් කරන ලදී. එකී සමාලෝචන වාර්තාව පදනම් කරගනිමින් විෂයභාර අමාත්‍යවරයා විසින් සංශෝධිත සීමා නිර්ණයන් පිළිබඳ ගැසට් පත්‍රය 2017 පෙබරවාරි මාසයේ 17වන දින ප්‍රසිද්ධ කරන ලදී.

මෙම ගැසට් පත්‍ර දෙක සලකා බැලීමේදී ශ්‍රී ලංකාව තුල පාළාත් පාලන ආයතන සඳහා-

- එක් සභිකයකු සහිත කොට්ඨාස - 4750ක්
- සභිකයන් දෙදෙනෙකු සහිත කොට්ඨාස - 165
- සභිකයන් තිදෙනෙකු සහිත කොට්ඨාස - 04

නිර්මාණය වන අතර ඒ අනව කොට්ඨාස මට්ටමින් සභිකයන් 5092ක් පත් වීමට නියමිතය.

2017 වසරේදී සිදු කරන ලද 2017 අංක 16 දරණ සංශෝධනය ට අනුව පලාත් පාලන ආයතන සඳහා කොට්ඨාස මට්ටමින් සභිකයන් 60%ක් ද සමානුපාතික ක්‍රමයට සභිකයින් 40%ක් ද පත් වීමට නියමිත බැවින් ඉදිරි ඡන්ද විමසීමේ දී පත්වන සමස්ථ සභික ප්‍රමාණය 8353ක් පමණ වේ.

# 03.
# නව පළාත් පාලන ආයතන ඡන්ද ක්‍රමයේ විශේෂතා

2012 වසරේ සිට 2017 දෙසැම්බර් දක්වා පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට ඉදිරිපත් කරන ලද පහත සංශෝධනයන් මගින් ඡන්ද විමසීම් ක්‍රමයේ විශාල වෙනසක් සිදුවී ඇත.

- 2012 අංක 22 දරන පලාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන)පනත
- 2016 අංක 1 දරන පලාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන)පනත
- 2017 අංක 16 දරන පලාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන)පනත
- 2017 අංක 31 දරණ පළාත් පාලන ඡන්ද විමසීම්(සංශෝධන)පනත

  මම සංශෝධනයන් සමග අවසන් වරට පලාත් පාලන ඡන්ද විමසීම් වලට වඩා බොහෝ සුවිශේෂී ලක්ෂණ මෙම ඡන්ද ක්‍රමයේ දක්නට ලැබේ. එනම්-

## i. **කොට්ඨාස හා සමානුපාතික මිශ්‍ර ක්‍රමයක් යටතේ ඡන්ද විමසීම පැවැත්වීම**

ඉහත පරිච්ඡේදවල සාකච්ඡා කළ පරිදී පළාත් පාලන ක්‍රමය ශ්‍රී ලංකාවේ ආරම්භ වන්නේ කොට්ඨාශයට නියෝජිතයෙක් හිමිවන ආකාරයෙනි. තම පලාක් පාලන කොට්ඨාශයේ නියෝජිතයා ගැමියන් විසින් "මැම්බර් මහත්තයා" ලෙස හඳුන්වනු ලැබීය. අදාල කොට්ඨාසයේ සියලු කටයුතු සඳහා වගකීමකින් යුක්තව සම්බන්ධවීමේ වගකීමක් මෙම මැම්බර් මහතා හෙවත් කොට්ඨාස නියෝජිතයා සතුවිය. පළාත් පාලන ආයතවලටද සමානුපාතික නියෝජනය හඳුන්වාදීමත් සමගම කොට්ඨාසයට වගකියන නියෝජිතයා අහිමි විය. නමුත් ඒ වෙනුවට සෑම ඡන්ද දායකයකුගේම ඡන්දයට වටිනාකමක් ලැබිණි. මුල් ක්‍රමයේදී ජයග්‍රාහී කොට්ඨාස අපේක්ෂකයාට ඡන්දය භාවිතා කරන්නන්ට පමණක් වටිනාකමක් ලැබුන අතර සමානුපාතික නියෝජන ක්‍රමය මගින් සෑම ඡන්දයකටම වටිනා කමක් ලැබෙමින් සමස්ථ පළාත් පාලන ආයතයට ලැබෙන ඡන්ද වලට සාපේක්ෂව නියෝජිතයන් පත්වන ක්‍රමයක් නිර්මාණය විය.

කොට්ඨාස ක්‍රමයේත් සමානුපාතික නියෝජන ක්‍රමයේත් පවතින වාසිදායක ලක්ෂණ ඇතුලත් වන හා මනාප පොරය තුරන් කෙරෙන මිශ්‍ර ක්‍රමයක් ලෙස කොට්ඨාස ක්‍රමය යටතේ අපේක්ෂකයින් 60%ක්ද ඉතිරි 40%සමානුපාතික ක්‍රමය යටතේද මෙම ඡන්ද විමසීම පවත්වයි.

## ii. කාන්තා නියෝජනය අනිවාර්ය වීම

ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින්ගෙන් 52% ක් කාන්තාවන් වුවද මහජන නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය ඉතා අඩු මට්ටමක පවතී. එම සීමිත කාන්තා නියෝජිතවරියන් අතරින් බහුතරයක්ද තම පියාගෙන් හෝ සැමියාගෙන් දායාදයක් ලෙස දේශපාලනයට පිවිසි පිරිසකි.

කාන්තාවන් දේශපාලනයට පිවිසීමට නිසි ක්‍රමවේදයක් නැතුවා මෙන්ම පවතින දේශපාලන රටාව කාන්තාවන් දේශපාලන භූමියෙන් ඈත්කරන සුලුය. මේ නිසා බොහෝ රටවල සිදුකරන්නාක් මෙන් මෙම පළාත් පාලන ඡන්ද විසීමේදී කාන්තා නියෝජනය අනිවාර්ය කර තිබේ. 2016 වසරේදී පලාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට සිදුකරන ලද මෙම සංශෝධනය නිසා සෑම පළාත් සභාවකම නියමිත අපේක්ෂක සංඛ්‍යාවෙන් 25% කාන්තාවන් කාන්තාවන් පත්වනු ඇත.

## iii .මනාප ක්‍රමය අහෝසි වීම

වත්මන් දේශපාලන වාතාවරණය තුළ මනාප ක්‍රමයට බොහෝදෙනා දක්වන්නේ දැඩි පළිකුලකි. සමහර දෙනෙක් එය මනාප පොරය ලෙසද හඳුන්වයි. සමහර යහපත් පුද්ගලයන් දේශපාලන භූමියට අවතීර්ණ වීම අධෛර්යයමත් කරන කාරණයක් ලෙසද මනාප ක්‍රමය හඳුනාගෙන ඇත. එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර ඇති වන මෙම අනවශ්‍ය පොරය නිසා සභාව තුළ කටයුතු කිරීමේදීද විශාල මතභේදයන්ට ලක්වන සිදුවීම් පිළිබඳ වාර්තා සුලබ විය.

හඳුන්වාදී ඇති නව ඡන්ද විමසීම් ක්‍රමය යටතේ මනාප ක්‍රමයක් නැත. ඡන්ද දායකයා සිය ඡන්දය ලකුණු කරනු ලබන්නේ තමන් කැමති දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට පමණි.

## iv. ඡන්ද මධ්‍යස්ථානයේම ඡන්දය ගණන් කිරීම

නව පලාත් පාලන ඡන්ද විමසීම් ක්‍රමයේ පවතින තවත් ස්විශේෂි ලක්ෂණයක් වන්නේ ඡන්දය ගණන් කිරීම ඡන්ද මධ්‍යස්ථානය තුලම සිදු කිරීමයි. මෙතෙක් එය සිදුවූයේ දිස්ත්‍රික්කයේ ගනන් කිරීමේ මධ්‍යස්ථානවලය.

සෑම ඡන්ද පොලකම ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරයි. එක් කොට්ඨාසයකට එක බැගින් ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන කල් ඇතිව හඳුනාගනු ලැබේ. අනෙක් ඡන්ද මධ්‍යස්ථානවල (ගණන් කිරීමේ මධ්‍යස්ථානවල) ප්‍රතිඵල එකී මධ්‍යස්ථානය වෙත ලබාදෙන අතර තැපැල් ඡන්ද පත්‍රිකාද එම ස්ථානයේදී ගණන් කරනු ලැබේ. එහි ප්‍රතිඵල අනුව කොට්ඨාශයේ සභිකයා කවුරුන්ද යන්න ගණන් කිරීම් අවසානයේ එම මධ්‍යස්ථානයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## ii. කාන්තා නියෝජනය අනිවාර්ය වීම

ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයින්ගෙන් 52% ක් කාන්තාවන් වුවද මහජන නියෝජිත ආයතනවල කාන්තා නියෝජනය ඉතා අඩු මට්ටමක පවතී. එම සීමිත කාන්තා නියෝජිතවරියන් අතරින් බහුතරයක්ද තම පියාගෙන් හෝ සැමියාගෙන් දායාදයක් ලෙස දේශපාලනයට පිවිසි පිරිසකි.

කාන්තාවන් දේශපාලනයට පිවිසීමට නිසි ක්‍රමවේදයක් නැතුවා මෙන්ම පවතින දේශපාලන රටාව කාන්තාවන් දේශපාලන භූමියෙන් ඈත්කරන සුලුය. මේ නිසා බොහෝ රටවල සිදුකරන්නාක් මෙන් මෙම පළාත් පාලන ඡන්ද විසීමේදී කාන්තා නියෝජනය අනිවාර්ය කර තිබේ. 2016 වසරේදී පලාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට සිදුකරන ලද මෙම සංශෝධනය නිසා සෑම පළාත් සභාවකම නියමිත අපේක්ෂක සංඛ්‍යාවෙන් 25% කාන්තාවන් කාන්තාවන් පත්වනු ඇත.

## iii .මනාප ක්‍රමය අහෝසි වීම

වත්මන් දේශපාලන වාතාවරණය තුළ මනාප ක්‍රමයට බොහෝදෙනා දක්වන්නේ දැඩි පළිකුලකි. සමහර දෙනෙක් එය මනාප පොරය ලෙසද හඳුන්වයි. සමහර යහපත් පුද්ගලයන් දේශපාලන භූමියට අවතීර්ණ වීම අධෛර්යයමත් කරන කාරණයක් ලෙසද මනාප ක්‍රමය හඳුනාගෙන ඇත. එකම පක්ෂයේ අපේක්ෂකයින් අතර ඇති වන මෙම අනවශ්‍ය පොරය නිසා සභාව තුළ කටයුතු කිරීමේදීද විශාල මතභේදයන්ට ලක්වන සිදුවීම් පිළිබඳ වාර්තා සුලබ විය.

හඳුන්වාදී ඇති නව ඡන්ද විමසීම් ක්‍රමය යටතේ මනාප ක්‍රමයක් නැත. ඡන්ද දායකයා සිය ඡන්දය ලකුණු කරනු ලබන්නේ තමන් කැමති දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට පමණි.

## iv. ඡන්ද මධ්‍යස්ථානයේම ඡන්දය ගණන් කිරීම

නව පලාත් පාලන ඡන්ද විමසීම් ක්‍රමයේ පවතින තවත් ස්විශේෂි ලක්ෂණයක් වන්නේ ඡන්දය ගණන් කිරීම ඡන්ද මධ්‍යස්ථානය තුලම සිදු කිරීමයි. මෙතෙක් එය සිදුවූයේ දිස්ත්‍රික්කයේ ගනන් කිරීමේ මධ්‍යස්ථානවලය.

සෑම ඡන්ද පොලකම ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරයි. එක් කොට්ඨාසයකට එක බැගින් ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන කල් ඇතිව හඳුනාගනු ලැබේ. අනෙක් ඡන්ද මධ්‍යස්ථානවල (ගණන් කිරීමේ මධ්‍යස්ථානවල) ප්‍රතිඵල එකී මධ්‍යස්ථානය වෙත ලබාදෙන අතර තැපැල් ඡන්ද පත්‍රිකාද එම ස්ථානයේදී ගණන් කරනු ලැබේ. එහි ප්‍රතිඵල අනුව කොට්ඨාශයේ සභිකයා කවුරුන්ද යන්න ගණන් කිරීම් අවසානයේ එම මධ්‍යස්ථානයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

## v. නාම යෝජනා සඳහා තරුණ නියෝජනය අනිවාර්ය නොවීම

1990 වසරේ සිට පළාත් පාලන ඡන්ද විමසීමක නාම යෝජනා ඉදිරිපත් කිරීමේදී පළාත් පාලන ආයතනයකට ඉදිරිපත් කළ යුතු මුලු නම් සංඛ්‍යාවෙන් 40%ක් වයස අවුරුදු 35ට අඩු තැනැත්තන්ගෙන් සමන්විය යුතු විය. නමුත් නව ක්‍රමය යටතේ එසේ අනිවාර්ය තරුණ නාමයෝජනා ක්‍රමය අහෝසි වී ඇත.

# 04.
# ඡන්ද විමසීම මගින් සභිකයින් තෝරාගන්නා ක්‍රමය

නව පළාත් පාලන ඡන්ද විමසීමේ ක්‍රමය මගින් තෝරාගන්නා සභිකයින් වර්ග 4ක් ඇත. එනම්

I. කේවල කොට්ඨාසවල සභිකයින්
II. බහු සභික කොට්ඨාසවල සභිකයින්
III. සමානුපාතික ක්‍රමයට පත්වන සභිකයින්
IV. අනිවාර්ය කාන්තා සභිකාවන්

ඒ අනුව එක් එක් සභිකයින් තෝරාගන්නා ආකාරය එකිනෙකට වෙනස්ය.

## i. කේවල කොට්ඨාසවල සභිකයින් තෝරා ගැනීම

අදාල කේවල කොට්ඨාසයේ සියලුම ඡන්ද ගණන් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධින කණ්ඩායමේ අපේක්ෂකයා අදාල කොට්ඨාසයෙන් එම පළාත් පාලන ආයතනය නියෝජනය කරන සභිකයා ලෙස තෝරාගනු ලැබේ.

## ii. බහු සභික කොට්ඨාසවල සභිකයින් තෝරාගැනීම

අදාල බහු සභික කොට්ඨාසයේ සියලුම ඡන්ද ගණන් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධින කණ්ඩායමේ අපේක්ෂකයින් දෙදෙනා/තිදෙනා අදාල කොට්ඨාසයෙන් එම පළාත් පාලන ආයතනය නියෝජනය කරන සභිකයන් ලෙස තෝරාගනු ලැබේ.

## iii. සමානුපාතික ක්‍රමයට පත්වන සභිකයින් තෝරාගැනීම

- අදාල පළාත් පාලන ආයතනයේ සමස්ථ වලංගු ඡන්ද ප්‍රමාණය එම පළාත් පාලන ආයතනයට පත්විය යුතු මුලු සභික සංඛ්‍යාවෙන් බෙදා "තීරක අංකය" නිශ්චය කරනු ලැබේ.
- අදාල දේශපාලන පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව එම තීරක අංකයෙන් බෙදා එම දේශාපලන පක්ෂයට එම පළාත් පාලන ආයතනයට ලැබිය යුතු සමස්ථ සභික සංඛ්‍යාව නිශ්චය කරනු ලැබේ. තවද යම්කිසි පක්ෂයක් හෝ කන්ඩා යමකට සමස්ත සභාවෙන් හිමිවන සංඛ්‍යාවට සමාන වැඩි සංඛ්‍යාවක් කොට්ඨාස වල්දී ලබා ඇති අවස්ථාවක එකී සභිකයන් සියළු දෙනාම පිරිමි සභිකයන් වන විටදී පක්ෂය හෝ කන්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාවද පළාත් පාලන ආයතනයේ මුළු වලංගු චන්ද සංඛ්‍යාවෙන් අඩු නරනු ලැබේ.

- එකී සමස්ථ සභික සංඛ්‍යාවෙන් එම දේශපාලන පක්ෂය ඒ වන විටත් කොට්ඨාස මගින් තෝරාගෙන ඇති සභික සංඛ්‍යාව අඩු කල විට එකී දේශපාල පක්ෂයෙන් එම පලාත් පාලන ආයතනයට සමානුපාතික ක්‍රමයට තෝරාපත්කල යුතු සභික සංඛ්‍යාව තිරණය කරනු ලැබේ.

## iv. අනිවාර්ය කාන්තා සභිකාවන් තෝරා ගැනීම

ඡන්ද විමසීමේදී ලැබූ මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 20% කට වඩා අඩු ඡන්ද ලබාගත් හා සභිකයින් තිදෙනෙකුට අඩුවෙන් තෝරාපත් කරගත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කරනු ලැබේ. තවද යම්කිසි පක්ෂයක් හෝ කන්ඩායමක් සමස්ථ සභාවෙන් හිමිවන සභික සංඛ්‍යාවට සමාන හෝ වැඩි සංඛ්‍යාවක් කොට්ඨාස වලින් දිනාගෙන ඇති අවස්ථා-වකදී එකී සභිකයන් සියළු දෙනාම පිරිමි සභිකයන් වන විටදී එකී පක්ෂය හෝ කන්ඩායම ලබාගත් ඡන්ද සංඛ්‍යාවද පළාත් පාලන අයතනයේ මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කරනු ලැබේ.

- එකී සංඛ්‍යාව පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගතයුතු මුළු සභික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට සමාන සංඛ්‍යාවෙන් බෙදනු ලැබේ. එය කාන්තා නියෝජනයට අදාල "තීරක අගය" ලෙස සලකනු ලැබේ.

- ඉතිරි (අඩුකල පක්ෂ හා කන්ඩායම් වල හැර) එක් එක් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එම තීරක අගයෙන් බෙදීමෙන් එම දේශපාලන පක්ෂය හෝ ස්වාධින කණ්ඩායම නියෝජනය කළ යුතු කාන්තා නියෝජිතයින් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඒ වන විටත් කොට්ඨාස මගින් තේරී ඇති කාන්තා නියෝජිතයින් සංඛ්‍යාවට අමතරව පක්ෂය විසින් තෝරාගත යුතු ඉතිරි සභික සංඛ්‍යාව සමානුපාතික ක්‍රමය යටතේ අදාල පක්ෂයට හිමි සභික සංඛ්‍යාවෙන් පත් කරනු ලැබේ.

# 05.
# පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම

## I. නාම යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම්

පළාත් පාලන ඡන්ද විමසීමක් සඳහා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් ඒ සඳහා අදාල මැතිවරණය සඳහා දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩයමක් මගින් ඉදිරිපත් කරන නාමයෝජනා පත්‍රයකට නම ඇතුලත් විය යුතුය. එසේ නම ඇතුලත් කිරිමට නම් පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත යටතේ 8 වන වගන්තිය යටතේ වන සභිකත්වය සුදුසුකම් සැපිරිය යුතු අතර එහි 9 වන වගන්තිය යටතේ වන නුසුදුසුකමකට යටත් නොවිය යුතුය.

### ■ සභිකත්වය ලැබීමට සුදුසුකම්

- ✔ ඡන්ද විමසිමට අදාල පළාත් පාලන බලප්‍රදේශයට අයත් කොටසක (ඡන්ද නාමලේඛනයේ නම ඇතුලත්ව තිබිම අවශ්‍ය නොවේ)

- ✔ එම ඡන්ද නාමලේඛනය සකස් කිරීම ආරම්භවූ වසරේ ජූනි මාසයේ පලමුවන දිනයේදී අදාල පළාත් පාලන බලප්‍රදේශයේ සාමාන්‍ය පදිංචිකරුවෙකු වීම

### ■ සභිකත්වය ලැබීමට නුසුදුසුකම්

- ✔ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නොවන තැනැත්තෙක්
- ✔ වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙක්
- ✔ අධිකරණ නිලධරයකු
- ✔ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු
- ✔ පොලිස් නිලධාරියකු
- ✔ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක පහත ධූරයක් දරණ රජයේ නිලධාරියකු

- ◆ 2007 ජුනි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,27,280කට නොඅඩු වූ හෝ යම් තදන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 2007 ජනවාරි මස 01 වන දිනට පෙර ඇතිකරන ලද ධූරයක්.

- ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක පහත ධූරයක් දරණ රජයේ නිලධාරියකු

- 2007 ජූනි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,27,280කට නොඅඩු වූ හෝ යම් තදන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික මුදල් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 2007 ජනවාරි මස 01 වන දිනට පෙර ඇතිකරන ලද ධූරයක්

- 2007 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද ධූරයන් සම්බන්ධයෙන් වන විට ඒ ධූරය ඇති කරන ලද දිනයේදී ඒ ධූරයට අදාළ වැටුප් පරිමාණයේ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩු වන්නේ නම් හෝ තදන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයකදී ඉහත පළමුව සදහන් ආරම්භක වැටුපට අනුරූපවන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධූරයක්

- යම් රාජ්‍ය සංස්ථාවක පහත දැක්වෙන ධූරයක් දරණ නිලධාරියකු

- 2009 ජනවාරි මස 01 වන දිනට වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප වර්ෂයකට රු 2,46,300 කට නොඅඩු වූ හෝ යම් තදන්තර වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ ඒ ආරම්භක වැටුපකට අනුරූප වන වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ වැටුප් පරිමාණයක් මත 2009 ජනවාරි මස 01 වන දිනට පෙර ඇති කරන ලද යම් ධූරයක්

- 2009 ජනවාරි මස 01 වන දිනයෙන් පසු ඇති කරන ලද යම් ධූරයක් සම්බන්ධයෙන් වන විට ඒ ධූරය ඇති කරන ලද දිනයේදී ඒ ධූරයට අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප ඉහත විෂයෙහි ධූරයකට ඒ දිනයේ දී අදාළ වන වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට නොඅඩුවන්නේ නම් හෝ තදන්තරව කරනු ලබන යම් වැටුප් ප්‍රතිශෝධනයකදී ඉහත පළමුව සදහන් ආරම්භක වැටුප අනුරූපවන යම් මුදල් ප්‍රමාණයක් වන්නේ නම් එවැනි යම් ධූරයක්

- වෙනත් පළාත් පාලන ආයතනයක සභිකයකු
- අදාල පළාත් පාලන ආයතනයේ සේවකයකු හෝ එකී ආයතනයේ සේවකයකුව සිට සභිකයන් තෝරා පත් කර ගැනීමේ දිනයට අවුරුද්දක් ඇතුලත සේවය අවසන් කළ තැනැත්තෙකු
- ආයතනයත් සමග ගිවිසුමක් ඇති තැනැත්තෙකු
- සිවිවිකල් පුද්ගලකු
- වස්තු භංගත්වයට පත් තැනැත්තෙතු
- මාස 12කට වැඩි කාලයක සිරදඩුවමක් සිටීම හෝ මරණීය දණ්ඩනය ලැබ එකී දඩුවම වෙනුවට සිරදඩුවම් ලබමින් සිටීම
- යම් විනිශ්චයාධිකරණයක් විසින් මැතිවරණ වරදක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මැතිවරණයක් සදහා ඉදිරිපත්වීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන්ගැනීමට නුසුදුස්සෙක් ලෙස තීරණය කළ තැනැත්තෙකු
- මෙම පනතේ 83 වගන්තිය යටතේ පළාත් පාලන මැතිවරණයකට ඉදිරිපත් වීමට හෝ රැස්වීම්වලට සහභාගී වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට නුසුදුස්සෙකු වුවහොත්
- මහජන ආයතන(දූෂණ වැළැක්වීමේ) ආඥා පනතේ 5 වන වගන්ති යේ සදහන් පරිදී වරදකරුවීමක් නිසා හෝ පරීක්ෂණ කොමිසමක තීන්දුවක් නිසා එම ආඥා පනතේ විස්තර කරන පරිදී මහජන ආයතනයක සභිකයකු වීමට නුසුදුස්සකු වූ තැනැත්තෙකු
- අපරාධ වරදකට මාස තුනකට වඩා වැඩිකාලයක් සිරදඩු විදිමින් සිටීම හෝ එය අවසන් වී වසර පහකට වඩා අඩු කාලයක් ගතවීම
- එක් නාමයෝජනා පත්‍රයකට වැඩි ගනනක නම ඇතුලත් වීම
- මහනගර සභා ආඥාපනතේ 277 නගර සභා පතතේ 184 හෝ ප්‍රාදේශීය සභා පනතේ 179 වගන්තිය යටතේ පලකරනු ලැබූ නියමයක් මගින් ඉවත් කරනු ලබන සභියකයකු එකී ඉවත් කිරීමෙන් වසර පහක් ඉක්ම ගොස් නොමැති අවස්ථාවකදී

- ✔ යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමකට අවම වශයෙන් එක් වර්ෂයකට පෙර එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සේවය කිරීම අවසන් නොවූ එම පළාත් පාලන ආයතනය සඳහා නාමයෝජනා ඉල්ලා සිටින ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැළී සිටින රජයේ නිලධරයෙක්, (මෙම අනු-ඡේදයේ කාර්යය සඳහා "ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධරයෙක්'' යන්නට සංවර්ධන, සුභසාධන, ආර්ථික, සමාජ සෞඛ්‍ය හෝ ඔහුගේ සේවා නියුක්තියේ විෂයය පථය තුළ වූ වෙනත් ක්‍රියාකාරකම්වල නියැලී සිටින තැනැත්තකු ඇතුළත් වේ.)

තමන් දරන ධූරයක් හේතුවෙන් නාම යොජනා ඉදිරිපත් කිරීමට නුසුදුසු වන තැනැත්තන්ට එකී ධූරයෙන් ඉල්ලා අස්වීමෙන් පසු නාමයොධනා ඉදිරිපත් කල හැකිය.

## II. නාමයෝජන ඉදිරිපත් කිරීම

මැතිවරණ කොමිෂන් සභාව පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. ඒ සඳහා නියමිත නාමයෝජනා කාල සීමාව හා ස්ථානය මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ ඒ ඡන්ද විමසීමට අදාලව නිවේදනය කරනු ලැබේ. නව පළාත් පාලන ඡන්ද විමසීම සඳහා සෑම දේශපාලන පක්ෂයක් හා ස්වාධීන කණ්ඩායමක් විසින්ම නාම යෝජනා ලැයිස්තු 2ක් ඉදිරිපත් කල යුතුය. එනම්

1. කොට්ඨාස නාමයෝජනා පත්‍රය (අපේක්ෂකයින්)
2. සමානුපාතික නාමයෝජනා පත්‍රය(අතිරේක නාමයෝජනා පත්‍රය)

මෙයින් පළමු නාමයෝජනා පත්‍රය අදාල කොට්ඨාස සඳහා තම පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් කරනු ලැබේ. කේවල කොට්ඨාසයක් නම් අදාල කොට්ඨාසයේ නම හා අංකය ඉදිරියේ එක් නමක්ද, බහු සභික කොට්ඨාසයක් නම් අදාල පරිදී නම් දෙකක් හෝ තුනක්ද සඳහන් කල යුතුය, මෙම ලැයිස්තුවේ පළාත් පාලන අයතනයේ මුළු සභික සංඛ්‍යාවෙන් 10% ක් කාන්තාවන් විය යුතුය.

දෙවන ලැයිස්තුව සඳහා පළාත් පාලන ආයතනයෙන් තෝරාපත් කරගත යුතු සභික සංඛ්‍යාවෙන් 40% කට 3ක් එකතු කිරීමෙන් ලබාගන්නා සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් කර ඉදිරිපත් කළ යුතුය. මෙම ලැයිස්තුවේ නම් අතරින් 50% ක් කාන්තාවන් විය යුතුය.

තරුණ අපේක්ෂකයින් නාමයෝජනා පත්‍රයට ඇතුලත් කිරීම මෙම ඡන්ද විමසීම සඳහා අනිවාර්ය නොවේ. එසේ වුවද අවශ්‍යනම් 30% තරුණයින් ඇතුලත් කලහැකි බව පනතේ සඳහන්ව ඇත.

මෙම සෑම නාමයෝජනා පත්‍රයක්ම අදාල දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ස්වාධින කණ්ඩායමේ නායක විසින් අත්සන් කර එම අත්සන සමාදාන විනිශ්චයකාරවරයකු විසින් සහතික කර තිබිය යුතුය.

නාමයෝජනා භාරදීම දේශපාලන පක්ෂයේ බලයලත් නියෝජිත විසින් හෝ ස්වාධින කණ්ඩායමේ නායකයන් විසින් සිදු කළ යුතුය.

## III. ඇප මුදල්

ඡන්ද විමසීම සඳහා නාමයෝජනා දැන්වීම තේරීම්භාර නිළධාරියා විසින් නිකුත්කරන ලද දිනයෙන් අරම්භවී නාමයෝජනා කාලසීමාව අවසන් දිනට පෙර දින මධ්‍යහන 12.00 දක්වා වූ කාල පරිච්චේදය තුලදී නාම යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධින කණ්ඩායම් විසින් ඇප මුදල් තැන්පත් කිරීම සිදු කළ යුතුය.

### ඇපමුදල ගණනය කිරීම

- පිළිගත් දේශපාලන පක්ෂ සඳහා නාමයෝජනා පත්‍රදෙකෙහි සඳහන් අපේක්ෂක සංඛ්‍යාවේ සෑම අපේක්ෂකයෙක් සඳහාම රුපියල් 1500ක් බැගින් වූ මුදලක්.

- ස්වාධින කණ්ඩායම් සඳහා- නාමයෝජනා පත්‍රදෙකෙහි සඳහන් අපේක්ෂක සංඛ්‍යාවේ සෑම අපේක්ෂකයෙක් සඳහාම රුපියල් 5000ක් බැගින් වූ මුදලක්.

එක් එක් පාළාත් පාලන ආයතන සඳහා වන සභික සංඛ්‍යාව 2017 නොවැම්බර් දින 2043/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් වන අතර, එක් එක් පළාත් පාලුන ආයතන නාමයෝජනා පත්‍රයක(පළමු හා දෙවන නාමයෝජනා පත්‍රවල) ඇතුලත් විය යුතු කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව 2017 නොවැම්බර් 17 වන දින අංක 2045/55 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇත,

# 06.
# මැතිවරණ ප්‍රචාරණය

මැතිවරණයයන් සඳහා නාමයෝජනා භාරදීමෙන් අනතුරුව සියළුම අපේක්ෂකයන් තම ජයග්‍රහනය පතා ප්‍රචාරක කටයුතු සිදුකරනු ලබයි. එහි දී තම පක්ෂ ලාංඡනය හා අංකය හා සිය රූපය වඩාත් ජනතාව තුළ ප්‍රචලිත කිරීමට සියළු අපේක්ෂකයින්ගේ අරමුනයි. ඒ සඳහා පවත්වන ප්‍රචාරක ක්‍රියාවලින් පිළිබඳ නීති තත්වයක් පළාත් පාලන ඡන්ද විමසීම් පනතේ දක්වා ඇත.

## I. පෝස්ටර් දැන්වීම හා අත් පත්‍රිකා (81අ වගන්තිය)

නාම යෝජනා භාරදුන් දිනයේ සිට ඡන්ද විමසීමේ දිනයෙන් පසු දිනය දක්වා පෝස්ටර් දැන්වීම් හා අත්පත්‍රිකා ප්‍රදර්ශනය කල හැකි ස්ථාන වන්නේ

1. අපේක්ෂකයා ගමන් කරන වාහනය
2. අනුමැතිය ලත් ඡන්ද ප්‍රචාරක රැස්වීම් පවත්වන ස්ථාන
3. නිවේදිත ප්‍රචාරක කාර්යාල පරිශ්‍රයන් තුල

මේ හැර මහජනයාට ඇතුළුවීමට අයිතියක් ඇති පොදු හෝ පුද්ගලික කිසිදු ස්ථා-

නයක, වාහනයක හෝ මහා මාර්ගයක අපේක්ෂකයන්ගේ ඡායාරූපයක්, ඡන්ද ලකුණ හෝ චිත්‍රයක් හෝ අපේක්ෂකයකු තෝරාපත්කර ගැනීමේ ඉඩකඩ වැඩිකිරීමේ කාර්යය සඳහා වන දැන්වීමක් ප්‍රදර්ශනය නොකල යුතුය.

එමෙන්ම අපේක්ෂකයකු ප්‍රවාහනය සඳහා භාවිතාකරන වාහනයක භාර වෙනත් කිසිදු පොදු හෝ

පෞද්ගලික කිසිම ස්ථානයක අපේක්ෂකයකු තෝරාපත් කරගැනීම් ඉඩකඩ වැඩිකිරීමේ අපේක්ෂාවෙන් ප්‍රදර්ශනය කරන කිසිදු කොඩියක් හෝ පතාකයක් ප්‍රදර්ශනය කිරීම තහනම් වේ.

## II. පුවත්පත්වල අසත්‍ය වාර්ථා පල කිරීම (81ඈ වගන්තිය)

ඡන්ද විමසීම  ඉදිරිපත් වී ඇති යම් අපේක්ෂකයකුගේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි ආකාරයට ඔවුගේ කියමන් හෝ කටයුත්තක් පිළිබඳව අසත්‍ය ප්‍රවෘත්තියක් යම් පුවත්පත හෝ වාර ප්‍රකාශනයක, ගුවන්විදුලි හෝ රූපවාහිනී මාධ්‍යක (පලකිරීම) විකාශනය කිරීම වරදක්වේ.

## III. පෙරහැර පැවැත්වීම (81අ (2ආ) වගන්තිය)

මැතිවරණයකට නාමයෝජනා භාරදුන් දින සිට ඡන්ද විමසීමේ දිනයට පසු දිනය දක්වා පසු එලඹෙන දින දක්වා කාලයක් තුල මැයිපෙලපාලි, සංස්කෘතික හෝ ආගමික ස්වරූපයේ පෙරහැර හැරුනවිට දේශපාලන ප්‍රචාරක අංගයක් ලෙස පෙරහැර යාම තහනම් වේ. එකී පෙරහැර සංවිධානය කිරීම මෙහෙයවීම හෝ එකී පෙරහැරක සාමාජිකයකු ලෙස සහභාගී වීමද වරදක් වේ. (පෙරහැර යන්නෙන් අදහස් වන්නේ 12දෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකි)

## IV. ආගමික ස්ථාවල මැතිවරණ ප්‍රචාරය සිදු කිරීම (81 (5)ඇ වගන්තිය

ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වී ඇති දේශපාලන පක්ෂයක් හෝ ස්වාධින කණ්ඩායමක් තෝරාපත් කරගැනීමට අනුබල දීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවැත්වීම හෝ පැවැත්වීමට අනුබල දීම වරදකි. එවන් සථානයකදී අත්පත්‍රිකා, දැන්වීම් කොලයක්, චිත්‍ර, අපේක්ෂකයන්ගේ රුව සහිත දැන්වීම්, ලකුනු, කොඩියක් බෙදාහැරීම වරදක්වේ. එසේම ඡන්දය දීමට හෝ නොදීම සඳහා බලපෑම් කෙරෙන ආගමික මෙහෙයක් හෝ අධ්‍යාත්මික සේවාවන් සිදුකිරීම වරදකි.

## V. මැතිවරණ ප්‍රචාරක කාර්යාල

මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිලිබඳ නිශ්චිත විධිවිදාන පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත තුල හෝ එහි සංශෝධන තුල දක්නට නොමැත. නමුත් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ පිළිබදව විධිවිධාන සලස්වා ඇත.

ඒ අනුව සෑම පක්ෂයක් හෝ ස්වාධින කණ්ඩායමක් සඳහාම පළාත් පාලන ආයතන බල ප්‍රදේශය සඳහා එක් මධ්‍ය ප්‍රචාරක කාර්යාලයක්ද ඒකල කොට්ඨාශ සඳහා එක් ශාඛා කාර්යාලයක් බැගින්ද බහු සභික කොට්ඨාශ සඳහා සභික සංඛ්‍යාව අනුව ශාඛා කාර්යාල දෙකක් හෝ තුනක්ද පවත්වාගෙන යා හැකිය. එම කාර්යාල පවත්වාගෙන යාම සඳහා අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් අවසරයක් ලබාගත යුතුය.

පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ 81අ(2ආ)(අ) වගන්තිය දක්වන්නේ ඡන්ද විමසීම් දිනයේ දී අපේක්ෂකයා සාමාන්‍යයෙන් පදිංචි ස්ථානයේ හැර වෙනත් කිසිදු ස්ථානයක අපේක්ෂකයා තෝරාගැනීමේ ක්‍රියාවලිය සඳහා තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් භාවිතා කිරීම වරදක් වන බවයි.

## VI. මැතිවරණ ප්‍රචාරක රැස්වීම්

මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පිළිබඳවද නිශ්චිත විධි විධාන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත තුල දක්නට නොලැබෙන නමුත් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ පිළිබද විධිමත්භාවයන් දක්වා ඇත. ඒ අනුව මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් පවත්වන ස්ථානයේ සැරසිලි කිරීම අදාල රැස්වීම ආරම්භ කිරිමට පැය 18 ක කාලයක් ඇතුලත සිදු කල යුතු අතර රැස්වීම නිමවී පැය 12ක් ඇතුලත සියලු සැරසිලි ඉවත් කරගත යුතුය. සැරසිලි සිදුකල හැක්කේ රැස්වීම පවත්වන ස්ථානයේ සිට මීටර් 400ක් දක්වා පමණි.

මෙම රැස්වීම් පැවැත්වීම හා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අදාල පොලිස් ස්ථානයෙන් බලපත්‍ර ලබාගත යුතුය.

## VII. ගෙයින්ගෙට ගොස් සිදුකරන මැතිවරණ ප්‍රචාර

ගෙයින් ගෙට ගොස් සිදුකරන මැතිවරන ප්‍රචාර පිළිබඳවද නිශ්චිත විධි විධාන පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත තුල දක්නට නොලැබෙන නමුත් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ පිළිබද විධිමත්භාවයන් දක්වා ඇත. ඒ අනුව එවැනි ප්‍රචාරක කණ්ඩායමක් සඳහා උපරිම වශයෙන් සහභාගී විය හැකි ගණන අපේක්ෂකයා සමග 11කි. එමෙන්ම එහිදී සංගීත කණ්ඩායම්, සංගීත භාණ්ඩ හො ශබ්දය උපදවන යම් භාණ්ඩ යොදාගත නොහැක.

## VIII. මැතිවරණ ප්‍රචාරක කටයුතු අධීක්ෂණය

මැතිවරණයකදී ප්‍රචාරක කටයුතු පිළිබඳ සුපරික්ෂාවෙන් සිටීම විශේෂයෙන්ම නීත්‍යානුකූල ප්‍රචාරක

කටයුතු බාධාවකින් තොරව සිදුකිරීමට අවශ්‍ය රැකවරණය සැලසීම වෙන්ම නීතිවි-රෝධී ප්‍රචාරක කටයුතු සිදුකරන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරිම හා එකී ප්‍රචාරක ද්‍රව්‍ය ඉවත් කිරීමේ නීතිමය වගකීම් පැවරි ඇත්තේ පොලිස් දෙපාර්තමේන්තුවටය. මේ සඳහා පොලිසිය පැමිණිල්ලක් ලැබී තිබීම අත්‍යවශ්‍ය නොවේ පොලිසියට එවැනි නීති විරෝධී ක්‍රියා පිළිබඳව දැනුවත්නම් ඒවා ඉවත් කිරීම හා වැලැක්වීමේ වගකිම ඇත.

## IX. මාධ්‍ය උපමාන

මැතිවරණ කාලය තුල එනම් මැතිවරණය පිළිබඳව මැතිවරන කොමිෂන් සභාව දැනුම්දීම සිදුකල දින සිට මැතිවරණය පවත්වන දිනය දක්වා කාලය තුළ සියලු මුද්‍රිත හා විද්‍යුත් මාධය සමබරව කටයුතු කල යුතු ආකාරය පිළිබඳව උපමාන නියම කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවසථාවේ 104 (අ) (5 ) ව්‍යවස්ථාව මගින් මැති- වරණ කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනූව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2017 12 04 දින අංක 1248/1 දරන ගැසට් නිවේදනය මගින් මාධ්‍ය උපමාන ප්‍රකාශයට පත් කොට ඇත.

## X. රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම

මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්

(i) ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීමග

(ii) ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම, තහනම් කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(4) ව්‍යවස්ථාව මගින් මැතිවරණ කොමිෂන් සභාවට පවරා ඇත.

එකී බලතල භාවිතා කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 4 වන දින අංක 2048/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන පනවා ඇත.

මෙම විධානයක් කඩ කිරීමට වරදකරුවන අයෙකුට රුපියල් ලක්ෂයක් දක්වා දඩ හා වසර තුනක් දක්වා බණ්ධනාගාර ගත කිරීමකින් දඩුවම් කල හැකිය.

## XI. සීමිත දේශපාලන අයිතිවාසිකම් සහිත නිළධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතවීම

ආයතන සංග්‍රහයේ xxxii පරිච්ඡේදය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට ඡන්දය දීමේ අයිතිය උරගා බැලීමට හැර රැස්වීම්වලට සහභාගිවීම හා ඕනෑම අපේක්ෂකයෙකුගේ හෝ පක්ෂයක ප්‍රචාරක කටයුතු සමග ක්‍රියාකාරීව සම්බන්ධවීම තහනම් කර ඇත.

එමෙන්ම සාම නිළධාරීන් සන්නද්ධ සේවා නිළධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ද මෙම සීමිත මැතිවරණ අයිතිවාසිකම් සහිත නිළධාරීන් ගනයට වැටේ. එවැනි අයෙකු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදකි. එවැනි නිළධාරීන් රාජකාරි වෙලාවන් තුළ හෝ රාජකාරියට බාදාවන පරිදි හෝ නිළ බලය යොදා ගනිමින් ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදක් ලෙස සැලකේ.

# 07.
# ඡන්ද දිනය හා ඡන්දය ප්‍රකාශ කිරීම

## I. ඡන්දදායකු වීමේ සුදුසුකම්

ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් ට ඡන්ද අයිතිය හිමිවේ. එය මූලික අයිතියක් බව ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ මගින්ද පිළිගෙන තිබේ. නමුත් පළාත් පාලන ඡන්ද විමසීමකදී ඡන්දය භාවිත කිරීම සඳහා පුරවැසියකු විසින් අවශ්‍යතා 2ක් සම්පූර්ණ කල යුතුය. එනම්

- වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.
- අදාල වර්ෂයේ ඡන්ද මධ්‍යස්ථානයට අදාල ඡන්ද හිමි නාමලේඛනයේ සිය නම ඇතුලත් වී තිබීම.

ඡන්ද දායකයකුගේ නම ඡන්ද හිමි නාමලේඛණයේ ඇතුලත්ව නැතිනම් ඔහුට ඡන්දය ලබාදීමට අවස්ථාව නොලැබේ.

## II. ඡන්දදායකයා හඳුනාගැනීම

ඡන්ද දායකයකු හඳුනාගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව හැඳුණුම්පත් කිහිපයක් පිළිගනු ලබයි.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියැදුරු බලපත්‍රය
- රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
- වැඩිහිටි හැඳුනුම්පත
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පූජ්‍ය/පූජක පක්ෂය සඳහා නිකුත් කර ඇති හැඳුනුම්පත
- මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත මෙම හැදුනුම් පත් අතරින් එකක් ඉදිරිපත් කරමින් සිය අනන්‍යතාවය තහවුරු කිරීමට සෑම ඡන්ද දායකයෙක්ම වගබලාගත යුතුය. රාජකාරි හැදුනුම්පත ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වලංගු නොවේ.

## III. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව

අදාල ඡන්ද විමසීම් ප්‍රදේශයේ භාරම්භාර නිළධාරි වරයා විසින් ඡන්ද නාමලේඛනයේ සිටින සෑම ඡන්ද දායකයකුටම ඡන්ද විමසීම පැවැත්වෙන දිනය ස්ථානය වේලාව හා අදාල ඡන්ද දායකයාගේ අනුක්‍රමික අංකය ඇතුලත් විස්තර සහිතව නිළ ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තැපැල් මගින් යවනු ලැබේ.

එය සෑම ඡන්ද දායකයකු වෙතම ඡන්ද විමසීමට දින 5කට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එකී නිළ දැන්වීම් පත්‍රිකාව තැපැල් මගින් භාරදීමට නොහැකිවන විට අදාල තැපැල් කාර්යාලයේ තබාගෙන නියමිත ඡන්ද දායකකු පැමිනිවිට එය තැපැල් ස්ථානාධිපති විසින් භාරදනු ලැබේ.

මෙම නිළ ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් විකිණීම මිළදී ගැනීම හෝ බලය නොමැතිව සැපයීම හෝ තමන්ට අයත් නැති පත්‍රිකාවක් ලඟ තබාගැනීම වරදකි.

ඡන්ද භාවිතා කිරීම සඳහා නිළ ඡන්ද දැන්වීම් පත්‍රිකාව අත්‍යාවශ්‍ය ලේඛනයක් නොවන නමුත් එය ඡන්දපොලට රැගෙන යාම මගින් පහසුවක් ඇති කරයි.

## IV. ඡන්ද දිනයේ තහනම් ක්‍රියා

මැතිවරණය පවත්වන ඡන්ද පොළ ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන ස්ථානයේ සිට සැතපුම් කාලක දුර ඇතුළත

1. ඡන්දය ඉල්ලීම
2. යම් පක්ෂයකට ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියන් පෙළඹවීම
3. ඡන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදීම හෝ වෙනත් ප්‍රචාරක කටයුතු තහනම් වේ.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන, දොරටුව අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයකදී ශබ්ද විකාශන යන්ත්‍ර හෝ වෙනත් ඕනෑම මිනිස් කටහඬ විස්ථාරණය හෝ ප්‍රති උත්පාදනය කරන යන්ත්‍ර ඡන්දපොළ නිළධාරීන්ට හෝ ඡන්ද පොළට පැමිණෙන අයට බාධාවක් ඇතිවන පරිදි ක්‍රියා කිරීම වරදකි.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළගත් ඡන්ද පොළ අසලත් අසංවර ලෙස ක්‍රියා කිරීම වරදකි.

## V. ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළු වීමට අවසරලත් පුද්ගලයන්

- අදාළ ඡන්ද හිමියන්
- ඡන්ද පොළ නිළධාරින්

- බලය ලත් ඡන්ද පොළ නියෝජිතයන්
- සංචාරක මැතිවරණ නිළධාරීන් (සහකාර තේරීම්භාර නිළධාරීන්)
- අපේක්ෂකයින් (එක්වරකට එක් අපේක්ෂකයකු පමණි)-රැඳී සිටිය නොහැක
- බලය ලත් මැතිවරණ නිරීක්ෂකයන්
- මැතිවරණ රාජකාරියේ නිරත පොලිස් නිළධාරීන්

## VI. ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රදර්ශයකල යුතු දැන්වීම්

සෑම ඡන්ද පොලකම අදාල ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පහත දැන්වීම් ප්‍රදර්ශන කලයුතුය.

- ඡන්දය දෙන ආකාරය පිළිබඳව ඡන්ද දායකයන්ට උපදෙස් දෙන දැන්වීම
- එක් දේශපාලන පක්ෂ හා ස්වාධින කණ්ඩායම්වල නම් හා ඔවුන්ට වෙන්කරන ලද ලකුණු ඇතුලත් දැන්විම.

## VII. ඡන්ද විමසීම් පවත්වාගෙන යාම

ඡන්ද පොළක මනා පැවැත්ම පිළිබඳ වගකීම ඡන්ද පොළ ජේෂ්ඨ ඡන්ද ස්ථානාධිපති නිළධාරී (SPO) සතුය. වරකට ඇතුළු කළයුතු ඡන්ද දායකයන් ගණන තීරණය කිරීමේ බලය ඔහු සතුය. යම් තැනැත්තකු ඡන්ද මධ්‍යස්ථානය තුළ ස්ථානාධිපතිගේ අණට අකීකරු වුවහොත් හෝ නොමනා ලෙස හැසිරුනහොත් එවැනි අයෙකු ඡන්ද මධ්‍යස්ථානයෙන් ඉවත් කරීමේ බලය ඔහු සතුය.

## VIII. ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ස්ථානාධිපතිගේ කාර්යයන්

- ඡන්ද පත්‍රිකා, නිළ මුද්‍රාව, නිළ ලකුණ, ඡන්ද හිමිගේ නාම ලේඛනය ඡන්ද පොළට පැමිණ සිටින අයට පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීම.

## IX. ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයන්ට භාරදීමේ පියවර

- ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්ද දායක යාගේ නම සහ අංකය හඬනගා කියවිය යුතුය.
- ඡන්ද දායකයාගේ අනන්‍යතාවය තහවුරුකරගත යුතුය.

- ඡන්දදායකයාගේ වම් අතේ සුළැගිල්ල මත නියමිත තීන්ත ආලේප කිරීම
- ඡන්ද දායකයාගේ අංකය ඡන්ද පත්‍රිකා පොතෙහි උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කළ යුතුය.
- ඡන්ද පත්‍රිකාව නිළ ලකුණින් මුද්‍රා තැබිය යුතුය. (තෙරපීම හෝ සිදුරු කිරීම)
- අදාළ ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකාවක් නිකුත්කළ බව දැක්වීම පිණිස ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදිය යුතුය. (මෙහිදී ඡන්ද පත්‍රිකාවේ අංකය නොයෙදිය යුතුයි).
- ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දිය යුතුයි.

## X. ඡන්දය දෙන ආකාරය

- ඡන්ද ස්ථානාධිපති විසින් සකස් කර ඇති ආවෘත ස්ථානයක ඡන්දය ප්‍රකාශ කළ යුතුය.
- ඡන්ද දායකයා විසින් ලකුණු කළ ඡන්ද පත්‍රිකාව තමාම ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතුය.
- යම් ඡන්ද දායකයකුට ඡන්දය දෙන ආකාරය ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්ටද පෙනෙන සේ පැහැදිළි කිරීම ස්ථානාධි පතිවරයාට හෝ ඔහුගේ නියෝජිතයෙකුට කළ හැකිය. නමුත්
- මෙහිදී යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මග පෙන්වීමක් නොකළ යුතුය.
- අන්ධ භාවය හෝ යම් ශාරීරික ආබාධයක් නිසා ඡන්දය දීමට අපොහොසත් වන අයෙකු සම්බන්දව ස්ථානාධිපති ඡන්ද දායකයාගේ උපදෙස් මත ඡන්දය ලකුණු කර පෙට්ටිය තුළට බහාලිය හැකිය.
- ඡන්දය භාවිතා කිරිමේදී අනවධානය නිසා වැරදීමක් වුව හොත් එය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කර ඔහු සෑහීමකට පත් වුවහොත් නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.

- අදාල ඡන්ද දායකයාගේ ඡන්දය වෙනත් අයෙකු භාවිතා කර ඇති විටක අදාල ඡන්ද දායකයා වෙත ද්විත්ව ඡන්ද පත්‍රිකාවක් ලබා දෙනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකාව වෙනත් වර්ණයකින් යුක්ත අතර එය ලබා දීමට පෙර ප්‍රකාශයකට අත්සන් ගනු ලබයි. එසේම ඔහුගේ නම ද්විත්ව ඡන්ද ලේඛනයට ඇතුළත් කළ යුතුය.
  - නව පළාත් පාලන මැතිවරණයේ මනාප ඡන්ද ලබාදීමක් නොමැති බැවින් තමන් කැමති අපේක්ෂකයා නියෝජනය කරනු ලබන දේශ පාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමට අදාල ලකුණ ඉදිරියේ කතිරය ගැසීම පමණක් සිදු කළ යුතු වේ.

## XI. ප්‍රකාශයක් කරන ලෙස ඡන්ද දායකයකුට නියම කිරීම

ඡන්ද පොලක ජ්‍යෙෂ්ඨ ඡන්ද පොල නිළධාරියාගේ අභිමතය පරිදී

- එකී නම සහ ලිපිනයෙන් හැඳින්වෙන්නේ තමාම බවට
- තමන් මෙම මැතිවරණය සඳහා වෙනත් ඡන්ද පොලක ඡන්දය දී නොමැති බවට.
- අදාල මැතිවරණයේ දී ඡන්දය දිමට නුසුදුසු පුද්ගලයකු නොවන බවට
- මෙම මැතිවරණයට අදාලව වෙනත් යම් මැතිවරණ කොට්ඨාශයක ඡන්දය දී නොමැති බවට

නියමිත ආකෘතියක් මගින් ප්‍රකාශයක් කරන ලෙස යම් ඡන්ද දායකයකුට නියම කල හැකියග එ වැනි ප්‍රකාශයක් කිරීම ප්‍රතියේක්ෂප කරන අයකුට ඡන්ද පත්‍රිකාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට ඡන්ද ස්ථානාධිපතිවරයාට බලය ඇත. එසේම ඉහත ප්‍රකාශකරයකදී අසත්‍ය තොරතුරු ලබාදෙන ඡන්ද දායකයකු මාස 6ක් දක්වා සිරදඬුවම ලැබිය හැකි වරදක් සිදුකරයි.

## XII. ඡන්ද විමසීම අවසන් කිරීම

නියමිත වෙලාව (පස්වරු 4.00 ) පසු කිසිම ඡන්ද දායකයකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබේ. නමුත් ඡන්ද පත්‍රිකා නිකුත් කර ඇති ඡන්ද දායකන්ට තම ඡන්දය සලකුණු කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.

# 08.
# ඡන්දය ගණන් කිරීම

## I. ඡන්ද ගණන් කිරීමේ ස්ථාන

නව පාලාත් පාලන ඡන්ද විමසීම් ක්‍රමවේදයේ පවතින සුවිශේෂීම ලක්‍ෂණය වන්නේ ඡන්දය ගනන් කිරීම ඡන්ද මධ්‍යස්ථානයේදීම සිදු කරනු ලැබීමයි.

ඒ අනුව ඡන්ද පෙට්ටි ගනන් කිරීමේ ස්ථාන කරා ගෙනයාමක් හෝ මැතිවරණ නිලධාරීන්ගේ වෙනසක් සිදු නොකර ඡන්ද මධ්‍යස්ථානයේදීම ගනන් කිරීම සිදු කරනු ලැබේ.

ඡන්ද මධ්‍යස්ථානයේ සිටින ජ්‍යෙෂ්ඨ ඡන්දපොළ නිළධාරියා ගනන් කිරීමේ අවස්ථාවේදී ඡන්ද ගනන් කිරීමේ නිළධාරියා ලෙස කටයුතු කරන අතර අනෙක් ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය ඡන්ද ගනන් කිරීමේ කාර්ය මණ්ඩලය බවට පරිවර්ථනය වේ.

එක් කොට්ඨාශයක ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් පවතින විට එක් එක් ඡනද පොල ඡනද ගණන් කිරීම අදාල තේරීම් බාර නිළදාරියා විසින් තීරනය නරන පරිදි සිදුකල යුතුය. කොට්ඨාශයේ ප්‍රතිඵල  නිකුත් කරනු ලබන්නේ මෙම ප්‍රධාන ගණන් කිරීමේ නිළධාරියා සිටින ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙනි.

නමුත් අවස්ථාවෝචිත පරිදී කොට්ඨාශයේ ඡන්ද මධ්‍යස්ථාන අතරින් එක් ඡන්ද මධ්‍යස්ථානයක ගණන් කිරීම පැවැත්වීමට හෝ එම ස්ථාන කිසිවක් ඡන්ද ගනන් කිරීමේ කාර්යය සඳහා සුදුසු නොවන්නේ නම් වෙනත් ස්ථානයක ඡන්දය ගණන් කිරීමට තීරණය කිරීමේ බලය තේරීම් භාර නිළධාරියා සතුය.

## II. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන්

සෑම ඡන්ද ගනන් කිරීමේ මධ්‍යස්ථානයකටම එක් දේශපාලන පක්‍ෂයක් හෝ ස්වාධින කණ්ඩායමක් වෙනුවෙන් ගණන් කිරිමේ නියෝජිතයින් දෙදෙනෙකු පත් කල හැකිය. අපේක්‍ෂකයකුට ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුලුවිය හැක්කේ ඔහු ගණන් කිරීමේ නියෝජිතයකු වන්නේ නම් පමණි.

## III. ඡන්ද ගණන් කිරීම

ඡන්ද විමසීම නිමවූ වහාම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් ඡන්ද ගණන් කිරීමබ සිදුකරන වේලාව නිළධාරීන්ට හා ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින්ට දැනුම්දිය යුතුය.පසුව අදාල ඡන්ද මධ්‍යස්ථානය තුල ඡන්දය ගණන් කිරීමෙන් අනතුරුව එම ප්‍රතිඵල කොට්ඨාශයේ ප්‍රධාන ගණන් කිරීමේ නිළධාරියා සේවයේ නියුතු ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලැබේ.

## IV. තැපැල් ඡන්ද ගණන් කිරීම

පළාත් පාලන ආයතන බලප්‍රදේශයේ එක් එක් කොට්ඨාශයේ ප්‍රධාන ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත අදාල කොට්ඨාශයට ලැබී ඇති ඡන්ද පත්‍රිකා යොමු කරනු ලැබේ. ඒ අනුව එහිදී එම ඡන්ද ගනන් කර ඡන්ද විමසීමේ දින ලැබුණු ඡන්ද ගනනට එකතු කරනු ලැබේ. තැපැල් ඡන්ද ප්‍රතිඵල නිකුත් කිරීමක් සිදු කරනු නොලැබේ.

## V. ප්‍රතිඵල නිකුත් කිරීම

### ඡන්ද/ගණන් කිරීමේ මධ්‍යස්ථානය තුල ප්‍රතිඵල නිකුත් කිරීම

- අදාල කොට්ඨාශය තුල ප්‍රධාන ගණන් කිරීමේ නිළධාරිය විසින් තම මධ්‍යස්ථානයේ ඡන්ද, තැපැල් ඡන්ද හා කොට්ඨාශයට අයත් අනෙක් ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ලැබුණ ප්‍රතිඵල එකතු කර වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්‍ෂයේ හෝ ස්වාධින කණ්ඩායමේ අපේක්‍ෂකයා එකී කොට්ඨාශය සඳහා තේරීපත්වූ සභිකයා ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ. එම කොට්ඨාශට බහු සභික කොට්ඨාශයක් නම් වැඩිම ඡන්ද ලැබූ දේශපාලන පක්‍ෂයේ හෝ කණ්ඩායමේ අපේක්‍ෂකයන් දෙදෙනා හෝ තිදෙනා අවස්ථාව අනුව එකී කොට්ඨාශය සඳහා තේරීපත් වූ සභිකයන් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.එසේම අනෙකුත් දේශපාලන පක්‍ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඉන් අනතුරුව අදාල සියලු ලේඛන පළාත් පාලන ආයතනයට අදාල තේරීම්භාර නිළධාරී වෙත යොමු කරනු ලැබේ.

### තේරීම්භාර නිලධාරී විසින් ප්‍රතිඵල නිකුත් කිරීම

තේරීම්භා නිළධාරී විසින් අදාල සියලු කොට්ඨාශවල ඡන්ද ප්‍රතිඵල සැලකිල්ල ගෙන එක් පක්‍ෂ හෝ ස්වාධින කණ්ඩායම් සමානුපාතික ක්‍රමයට පත් කල යුතු අපේක්‍ෂකයින් ගේ සංඛ්‍යව හා අනිවාර්ය කාන්තා අපේක්‍ෂකයින්ගේ සංඛ්‍යාව නිවේදයනය කරනු ලැබේ.

එකී ප්‍රතිඵල මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන අතර කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ එල කරනු ලැබේ.

## V. ගණන් කිරීමේදී ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප කරන අවස්ථා

- නිළ ලකුණින් ලකුණුකර නොමැති ඡන්ද පත්‍රිකා
- ඡන්ද පත්‍රිකාව මත එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වඩා වැඩි සංඛ්‍යාවකට ඡන්දය සලකුණු කොට ඇති අවස්ථාවක
- ලකුණු කොට නොමැතිනම් හෝ ඡන්දය ලකුණු කොට ඇත්තේ යන්න අවිනිශ්චිත වීම හේතුවෙන් අවලංගු වේ නම්

# 09.
# පළාත් පාලන ආයතනය පිහිටුවීම

## I. පළාත් පාලන ඡන්ද විමසීමකින් පසු පළාත් පාලන ආයතන පිහිටුවීමේ විශේෂතා

පළාත් සභා මැතිවරණ වලදී හා පාර්ලිමේන්තු මහ මැතිවරණ වලදී දිස්ත්‍රික්කයේ ජයග්‍රහනය ලබාගන්නා දේශපාලන පක්ෂ හෝ ස්වාධින කණ්ඩායම් සඳහා බෝනස් ආසන හිමිවේ. නමුත් මෙම ඡන්ද විමසීමෙන් ජයග්‍රහනය ලබන්නන්ට බෝනස් ආසන හිමි නොවේ. එබැවින් කිසියම් පක්ෂයකට හෝ ස්වාධින කණ්ඩායමකට විශාල බහුතරයක් හිමි වීමේ සම්භාවිතාව අල්පය.

## II. ජයග්‍රාහී දේශපාලන පක්ෂයේ ලේකම් විසින් පලාත් පාලන ආයතනයේ ප්‍රධානියා පත් කිරීම

යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් ආසන සංඛ්‍යාවෙන් සියයට පනහකට වැඩියෙන් ලබා ඇති අවස්ථාවක දී එම පලාත් පාලන ආයතනයේ උචිත පරිදී නගරාධිපති නියෝජ්‍ය නගරාධිපති සභාපති උපසභාපති පත් කල යුත්තේ එකී සභික කණ්ඩායමේ කවර සභිකයෙක්ද යන්න නම් කර එවන ලෙස කොමසාරිස් වරයා විසින් අදාල ජයග්‍රාහී පක්ෂයේ මහලේකම්ගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිනු ලැබේ. එකී නම් කිරීම අනුව තේරීම්භාර නිළධාරි විසින් අදාල පරිදී නගරාධිපති නියෝජ්‍ය නගරාධිපති සභාපති උප සභාපති ලෙස නම් කරනු ලැබේ.

## III. සභිකයින්ගේ ඡන්දයෙන් පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා පත් කිරීම

යම් කිසි පළාත් පාලන ආයතනයක කිසිදු දේශපාල පක්ෂයක් හෝ ස්වාධින කණ්ඩායමක් පළාත් පාලන ආයතනයේ නියමිත සභික සංඛ්‍යාවෙන් සියයට පහනකට වඩා අඩුවෙන් ලබාගෙන ඇති විට තේරීපත් වූ සභිකයින්ගේ නම් ගැසට් පත්‍රයේ පලකිරීමෙන් සතියක් තුල පළාත් පාලන කොමසාරිස් විසින් ලිඛිත නිවේදනයක් මගින් අදාල පළාත් පාලන ආයතනයේ පළමු රැස්වීම කැඳවිය යුතුය.

## IV. පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙකු දෙදෙනෙකු ඉල්ලා අස්වූ විට

යම් පළාත් පාලන ආයතනයක නරාධිපති හෝ සභාපති ඉල්ලා අස්වූ විට අදාල දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ ලේකම් වෙතින් සුදුසු නමක් තේරීම්භාර නිළධාරියා විසින් කැඳවනු ලැබේ.

දෙවන වරට පත්කරන ලද එම පළාත් පාලන ප්‍රධානියාද ඉල්ලා අස්වන්නේ නම් එම පළාත් පාලන ආයතනය විසුරුවා හරින ලද පළාත් පාලන ආයතනයක් ලෙස සලකන අතර එකී පළාත් පාලන ආයතනය අයත් පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ ආන්ඩුකාර වරයා විසින් එකී පළාත් පාලන ආයතනය සඳහා විශේෂ කොමසාරිස්වරයෙකු පත් කල යුතුය.

## V. පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතනයක යම් පුරප්පාඩුවක් සිදුවුවහොත් ඒ සඳහා සුදුසු පුද්ගලයකු සභිකයකු ලෙස නම් කර එවන ලෙස තේරීම්භාර නිළධාරියා විසින් පුරප්පාඩු වූ සභිකයා අයත් වන දේශපාලන පක්ෂයේ ලේකම් වෙත ලිඛිතව දැනුම්දෙනු ලැබේ. ඒ අනුව පළාත් සභා ආඥා පනතේ 8 වන වගන්තියේ සුදුසුකම් සපුරාලන පුද්ගලයකු අදාල ලේකම්වරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය. පුරප්පාඩු වූ සභිකයාගේ ඉතිරි ධුරකාලය එකී නව සභිකයා විසින් දරනු ලැබේ. පුරප්පාඩුව කාන්තා සභිකාවියක් නම් නව පත් කිරීමද කාන්තාවක් විය යුතුය.

# 10.
# පළාත් පාලන ඡන්ද විමසීමට අදාල වැරදි හා දූෂණ

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමකට අදාලව වැරදි හා දූෂණ ක්‍රියාවන් නීති ක්ෂෙත්‍ර කිහිපයක් ඔස්සේ හදුනාගෙන ඇත. එනම්

I. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සදහන් මැතිවරණ වැරදි
II. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත යටතේ වැරදි
III. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරදි
IV. ආයතන සංග්‍රහය යටතේ වැරදි

## I. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සදහන් මැතිවරණ වැරදි

ඡන්ද විමසීමකදී රාජ්‍ය දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු වැළැක්වීම සදහා අවශ්‍ය පියවර ගැනීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතු බව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව දක්වා සිටයි. ඒ අනුව "(4) (අ) මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් ඨ-

- අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් කල හැකිය.

- ඒ ඡන්ද විමසීමේ දී තරඟ කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම, කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මගින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ) එවැනි විධානයකට අනුකූලවීම සහ එය ක්‍රියාත්මක කිරීම, තත්කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිලධරයකුගේ ම කාර්යය විය යුත්තේ ය.

කොමිසම විසින් පනවන ඉහත විධානවලට අනුකූලව කටයුතු නොකිරීම වරදක් වන අතර එවැනි නිළධාරියකු රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් කල හැකිය

මේ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 04 වන දින අංක 2048/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන පනවා ඇත.

## ii. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත යටතේ වැරදි

### ඡන්ද පත්‍රිකා සම්බන්ධ වැරද

- ඡන්ද පත්‍රිකාවන් හෝ නිළ ලකුණක් විකෘති කිරීම
- නිළ බලයක් නොමැතිව ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තෙකුට සැපයීම
- ඡන්ද පත්‍රිකා මිළදී ගැනීම හෝ සැපයීම
- නිළ ලකුණ යෙදා ඇති ඡන්ද පත්‍රිකාවන් තම සන්තකයෙහි තබා ගැනීම
- ළකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්ද පොල තුලදි ප්‍රදර්ශනය කිරීම
- ඡන්ද පත්‍රිකාවන් නොවන දෙයක් ඡන්ද පෙට්ටියට දැමීම
- ඡන්ද පත්‍රිකාවක් බලය නොමැතිව ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටතට ගෙනයාම
- ඡන්ද පෙට්ටියක් හෝ මුද්‍රා තැබූ ඡන්ද පත්‍රිකා නිළබලයක් නොමැතිව විවෘත කිරීම හෝ විනාශ කිරීම
- ඡන්ද පත්‍රිකාවන් බලය නොමැතිව මුද්‍රණය කිරීම
- ඡන්දය දීමට නීත්‍යානුකූලව නොහැකිබව හෝ ඡන්දය දීම තමා නුසුදුස්සෙකුව සිටින බව දැන දැනම ඡන්දය භාවිතා කිරීම

### මැතිවරණ ප්‍රචාරයන් සම්බන්ධ වැරදි

නාමයෝජනා කැඳවූ දින සිට ඡන්ද විමසීම පවත්වන දිනට පසු දින දක්වා

- අවසර නොමැති ස්ථානවල මැතිවරණ පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම
- පෙරහැර පැවැත්වීම
- මාර්ගය මත ඡන්ද ලකුණු ප්‍රදර්ශනය කිරීම
- මාර්ග හරහා ධජයක් හෝ පතාකයක් ප්‍රදර්ශනය කිරීම
- පූජනීය ස්ථානයක මැතිවරණ රැස්වීම් සංවිධානය කිරීම
- පූජනීය ස්ථානයක මැතිවරණ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීම

මේ හැරුන විට යම් දේශපාලන පක්ෂයකට සහය දීම හෝ නොදීම හේතුවෙන් ආගමික සංවිධානයකින් ඉවත් කිරීම හෝ සේවා ස්ථානයකින් ඉවත් කිරීම ද වරදක් වේ. මෙම වැරදි සඳහා දඩය හෝ සිරදඬුවම් වලට අමතරව එවැනි පුද්ගලයකුට වසර පහක් යන තෙක් පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස තෝරාගැනීමට නුසුදුස්සෙකු වනු ඇත.

**දූෂණ ක්‍රියා**

- ජීවත්ව සිටින හෝ මිය ගොස් ඇති හෝ ව්‍යාජ පුද්ගලයකු හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෙනී සිටිමින් ඡන්දය දීම.
- තමාගේම නමින් හෝ නම් යටතේ ඡන්ද විමසීමේදී එක් වරකට වඩා ඡන්දය දීම.
- තමාට ඡන්දය දීම වෙනුවෙන් හෝ වෙනත් අයෙකුට ඡන්දය දීම වැළැක්වීම වෙනුවෙන් දූෂිත ලෙස බලපෑම් කිරීම සඳහා යම් සංග්‍රහයක් කිරීම හෝ එවැනි සංග්‍රහයක් ලබා ගැනීම.
- යම් ආගමික රැස්වීම් වලදී ඡන්ද හිමියන් යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම.
- ඡන්දය දීම හෝ නොදීම නිසා ආගමික සංවිධානයකින් නෙරපන බවට බලපෑම් කිරිම.
- යම් අපේක්ෂයකුට ඡන්දය දීම හෝ නොදීම නිසා සේවයෙන් නෙරපන බවට හෝ යම් ප්‍රතිලාභ හෝ සේවාවන් අත්හිටුවන බවට සේවා යෝජකයකු විසින් සේවකයන්ට බලපෑම් කිරීම.
- ඡන්දය දීම හෝ නොදීම සඳහා අල්ලස් ලබා දීම.

## ඡන්ද විමසීම් දිනයේ තහනම් ක්‍රියා

මැතිවරණය පවත්වන ඡන්ද පොළ ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන ස්ථානයේ සිට සැතපුම් කාලක දුර ඇතුළත

1. ඡන්දය ඉල්ලීම
2. යම් පක්ෂයකට ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියන් පෙළඹවීම
3. ඡන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදීම හෝ වෙනත් ප්‍රචාරක කටයුතු තහනම් වේ.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන, දොරටුව අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයකදී ශබ්ද විකාශන යන්ත්‍ර හෝ වෙනත් ඕනෑම මිනිස් කටහඬ විස්ථාරණය හෝ ප්‍රති උත්පාදනය කරන යන්ත්‍ර ඡන්දපොළ නිළධාරීන්ට හෝ ඡන්ද පොළට පැමිණෙන අයට බාධාවක් ඇතිවන පරිදි ක්‍රියා කිරීම වරදකි.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟත් ඡන්ද පොළ අසලත් අසංවර ලෙස ක්‍රියා කිරීම වරදකි.

## මැතිවරණ කොමිසමට ඡන්ද මධ්‍යස්ථානයක් ශූන්‍ය කල හැකි අවස්ථා

### (2012 අංක අංක 22 දරණ පලාත් පාලන මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 72අ වගන්තිය)

- නියමිත වේලාවට අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකිවීම
- ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම
- ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම
- ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොළෙන් පිටතට පළවා හැරීම
- මාර්ගයේ යම් අවහිරතාවක් නිසා ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිණීමට නොහැකි වීම
- ඡන්ද පොළේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොළේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම
- කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම
- කිසියම් ඡන්දපොළක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම

මෙවැනි සිදුවීමක් යම් ඡන්ද මධ්‍යස්ථානයක සිදු වුවහොත් ඒ පිලිබඳව අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලිධාරී විසින් ඒබ ව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කල යුතු අතර කොමිසම විසින් පරීක්ෂණයක් සිදු කර අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය ශූන්‍ය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම පරීක්ෂණය සඳහා ජෝෂ්ඨ ඡන්ද පොල නිළධාරිගේ වාර්තාව සංචාරක සහකාර තේරීම්භාර නිළධාරීන්ගේ වාර්තා ඡන්ද මධ්‍යස්ථායේ රාජකාරි නියතු පොලිස් නිළධාරීන්ගේ වාර්තා සංචාරක පොලිස් නිළධාරීන්ගේ වාර්තා ඡන්දපොළ නියෝජිතයින්ගේ වාර්තා මෙන්ම ස්වාධීන මැතිවරණ නිරීක්ෂකයින්ගේ වාර්තාද සැලකිල්ලට ගනුලැබේ.

## III. දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරදි

දණ්ඩ නීති සංග්‍රහයේ ෂඩඅ වෙනි පරිච්ඡේදය වෙන් වී ඇත්තේ ඡන්ද විමසීම් සම්බන්ධ වැරදි පිළිබඳව විස්තර කිරීම සඳහාය. එකී පරිච්ඡේදයේ පහත වැරදි ඡන්ද විමසීම් පිළිබඳ වැරදි ලෙස හඳුනාගෙන ඇත.

- අල්ලස් දීම, යම් අපේක්ෂකයකුට ඡන්දය ලබාදීම සඳහා යම් තුටු පඬුරු හෝ තෑගි ලබාදීම හෝ ලබාගැනීම වරදක් ලෙස සලකයි.
- ඡන්ද විමසීම්වල අයථා බලය යෙදීම, ඡන්ද දායකයකුට නිදහසේ ඡන්දය භාවිතා කිරීමට බාධාවන පරිදි තර්ජනය කිරීම හෝ බලපෑම් සිදු කිරීම වරදකි.
- වෙනත් තැනැත්තෙකු ලෙෂ පෙනී සිටීම-ජීවත්ව සිටින හෝ මියගිය අයෙකු ලෙස පෙනී සිටිමින් ඡන්දය භාවිතා කිරීම වරදකි.

## IV. ආයතන සංග්‍රහය යටතේ වැරදි

### සීමිත දේශපාලන අයිතිවාසිකම් සහිත නිළධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතවීම

ආයතන සංග්‍රහයේ XXXii පරිච්ඡේදය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට ඡන්දය දීමේ අයිතිය උරගා බැලීමට හැර රැස්වීම්වලට සහභාගිවීම හා ඕනෑම අපේක්ෂකයෙකුගේ හෝ පක්ෂයක ප්‍රචාරක කටයුතු සමග ක්‍රියාකාරීව සම්බන්ධවීම තහනම් කර ඇත.

එමෙන්ම සාම නිළධාරීන් සන්නද්ධ සේවා නිළධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ද මෙම සීමිත මැතිවරණ අයිතිවාසිකම් සහිත නිළධාරීන් ගනයට වැටේ. එවැනි අයෙකු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදකි.

## IV. ආයතන සංග්‍රහය යටතේ වැරදි

### සීමිත දේශපාලන අයිතිවාසිකම් සහිත නිළධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතවීම

ආයතන සංග්‍රහයේ XXXii පරිච්ඡේදය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරීන්ට ඡන්දය දීමේ අයිතිය උරගා බැලීමට හැර රැස්වීම්වලට සහභාගිවීම හා ඕනෑම අපේක්ෂකයෙකුගේ හෝ පක්ෂයක ප්‍රචාරක කටයුතු සමග ක්‍රියාකාරීව සම්බන්ධවීම තහනම් කර ඇත.

එමෙන්ම සාම නිළධාරීන් සන්නද්ධ සේවා නිළධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ද මෙම සීමිත මැතිවරණ අයිතිවාසිකම් සහිත නිළධාරීන් ගනයට වැටේ. එවැනි අයෙකු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදකි.

# 11.
# පළාත් පාලන සභිකයකුගේ කාර්යභාරය

## i. පළාත්පාලන ආයතවල නීතීමය පසුබිම

පළාත් පාලන ආයතන ස්ථාපනය වන්නේ අදාල පනත් මගිනි.ඒ අනුව පලාත් පාලන ආයතන ස්ථාපනය කල පනත් 3ක් පවතී.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනත
255 වන අධිකාරිය දරණ නගර සභා පනත
252 වන අධිකාරිය දරණ මහනගර සභා පනත අනුව පලාත් පාලන ආයතනයක බලතල හා කාර්යන් මෙන්ම ඒ හා බැදුනු මූලික නීති තත්වයන් මෙම පනත් තුල අන්තර්ගතවේ. පලාත් පාලන අයතනය නිතිමය පුද්ගලයෙකි. එනම් තම නමින් නඩු පැවරීමට හා නඩු පවරුනු ලැබීමට යටත්විය හැකිය.

## ii. පළාත් පාලන ආයතනයක සංයුතිය

පලාත් පාලන ආයතනයක බලවත්ම ඒකකය වන්නේ මහජන නියෝජිතයින්ගෙන් සමන්විත සභාවයි. පලාත් පාලන ආයතනයේ සියළු බලතල ගොනු වී ඇත්තේ මෙම සභාව වෙතය. එම මහජන නියෝජිතයින් අතරින් වඩාත්ම විශ්වාසය දිනාගත් පුද්ගලයා හෝ පාලක පක්‍ෂය විසින් නම්කල පුද්ගලයා නගරාධිපති/ සභාපති වන අතර ඔහුගේ සහයක නිළධාරියා උප නගරාධිපති/ උප සභාපති ලෙස හැඳින්වේ. සභාපති හා උපසභාපති පාලක පක්‍ෂයොන් පත්වන අතර විපක්‍ෂ කණ්ඩායමේ නායකයා විපක්‍ෂ නායක ලෙස පත්වේ. සභාවේ ප්‍රධාන පරිපාලන නිළධාරියා ලෙස පලාත්පාලන අමාත්‍යංශය විසින් පත්කර නාගරික කොමසාරිස් වරයකු / සභා ලේකම්වරයෙකු සිටින අතර ඔහු මහජන නියෝජිතයකු නොවන අතර රජයේ නිළධාරියෙකි. ඔහු යටතේ පලාත් පාලන ආයතනයේ නිළධාරී මඩුල්ලක් ක්‍රියාත්මක වේ.

### නගරාධිපති/ සභාපති

පලාත් පාලන ආයතනයේ ප්‍රධානියා නගරාධිපති/සභාපති වේ. සෑම සභා රැස්වීමකම මුලයුත දරන්නේ සභාපතිය. විශේෂ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය බව හැඟීයන ඕනෑම අවස්ථාවන විශේෂ රැස්වීම් කැදවීමේ බලය නගරාධිපතිට / සභාපතිවරයාට ඇත එමෙන්ම රැස්වීම් පිළිබඳ සියළුම බලතල හිමිවන්නේ නගරාධිපතිට / සභාපතිවරයාටයි. එමෙන්ම පලාත් පාලන ආයතනයේ අයවැය ඉදිරිපත්කරන්නේ නගරාධිපති / සභාපති විසිනි.

පලාත් පාලන ආයතන වලට අදාල මුල් පනත් මගින් පැවරී ඇති මෙම බලතල බලතල වලට අමතරම මධ්‍යම පරිසර අධිකාරි පනත ආහාර පනත වැනි වෙනත් පනත් කිහිපයක් මහින්ද බලතල පැවරි ඇත.

පලාත් පාලන ආයතන වලට අදාල මුල් පනත් මගින් පැවරී ඇති මෙම බලතල බලතල වලට අමතරම මධ්‍යම පරිසර අධිකාරි පනත ආහාර පනත වැනි වෙනත් පනත් කිහිපයක් මහින්ද බලතල පැවරි ඇත.

## උප නගරාධිපති/උප සභාපති

නගරාධිපතිවරයා / සභාපති වරයා නොමැති අවස්ථාවලදී රැස්වීම්වල මුලසුන ගැනීමක් අදාල කාර්යයන් ආවරණය කිරීමක් සිදු කිරීම් උප නගරාධිපති / උප සභාපති වරයාගේ වගකීමකි.

## විපක්ෂනායක

පලාත් පාලන ආයතනයේ විපක්ෂ මහජන නියෝජිත කණ්ඩායමේ බහුතර කණ්ඩායමේ නායකයා විපක්ෂනායකයා ලෙස පත්වේ. මෙය පනතේ සදහන් තනතුරක් නොවේ. එයින් අදහස් කරන්නේ සියලුම මහජන නියෝජිතයින් සාමුහිකව පලාත් පාලන ආයතනයේ අරමුණු වෙනුවෙන් ක්‍රියාකාරී විය යුතු බවකි

## නාගරික කොමසාරිස් /ලේකම්

මහනගර සභාවන්හි ප්‍රධාන පරිපාලන නිලධාරියා නාගරික කොමසාරිස්වරයා වන අතර නගර සභා සහ ප්‍රාදේශිය සභාවල ප්‍රධාන පරිපාලන නිළධාරියා ලේකම් මේ ඔහු පළාත් පාලන අමාත්‍යංශයේ අතර පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ඍජු අධීක්ෂණයට භාජනයවන නිළධාරියෙකි. සභාවේ සිටින කාර්යමංඩලයේ ප්‍රධානියා වන්නේ ද නාගරික කොමසාරිස් / ලේකම් වරයාවේ. මහා සභා රැස්වීම් සංවිධානය කිරීමේ දී එහි සාකච්චාවට භාජනය විය යුතු කරුණු ගොනුකිරීමත් ඒ පිළිබඳව කොමසාරිස්/සභාපතිවරයාව දැනුවත් කිරීමක් ලේකම්වරයාගේ වගකීමකි. එමෙන්ම රැස්වීම් න්‍යාය පත්‍රය සකස් කිරීම, සභාගත කලයුතු ලිපිලේඛන හා විස්තර සාමාජිකයින්ට බෙදාදීමද කොමසාරිස් /ලේකම්වරයාගේ වගකීම වේ.

## iii.පළාත් පාලන ආයතනයක කාර්යයන්

පලාත් පාලන ආයතනයක මූලිකව කාර්යවන්නේ තම විෂය පථයට අයත් කරුණු පිළිබඳ අනු නීති (රීති) පනවා එම කටයුතු විධිමත් ලෙස සිදු කිරීමය. එමෙන්ම වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා අවශ්‍යවන අයවැය සම්පාදනය කිරීම හා අනුවත කිරීමද මෙහි ප්‍රධාන කාර්යකි.

එයට අමතරව ප්‍රාදේශීය පලාත් පාලන ආයතනයක නියෝජිතයින්ට පහත කාර්යන්ද පැවරි ඇත.

## iv.පලාත් පාලන ආයතනයට අයිති පරිපාලන හා සංවර්ධන වැඩවලට ජන සහභාගීත්වය ලබාගැනීම

- මහජන සෞඛ්‍යය
- පොදු මහජන සේවා
- මංවාවක් නඩත්තුව හා සංවර්ධනය
- බලපත්‍ර ගාස්තු අයකිරීම
- බදු අයකිරීම
- පුණ්‍යාධාර දීම
- තොටුපලවල් පිහිටු වීම
- ආගමික සංස්කෘතික උත්සව සංවිධානය
- පානීය ජල සැපසුම
- ප්‍රාදේශීයේ පදිංචිකරුවන්ට රැකියා වැඩ පිළිවෙලවල් සකස් කිරීම

## v. පළාත් පාලන ආයතනයක බලතල

පළාත් පාලන ආයතන සඳහා අදාල මුල් පනත් මගින් මෙන්ම වෙනත් පනත් රාශියක් යටතේ ද බලතල පැවරී ඇත. ඒ අනුව පළාත් පාලන පනත් යටතේ ගාස්තු හා වරිපනම් බදු පැනවීම සිදුකල හැකිය. එමෙන්ම තම බල ප්‍රදේශය තුල ඇති ඉඩම් සභාවේ පොදු අවශ්‍යතා සඳහා මැනීම හා පවරාගැනීම සිදුකල හැකිය ප්‍රාදේශීය සභාවේ බලතල වඩාත් සාමාණ්‍ය ජනතාවට දනෙන්නේ වෙනත් පනත් මගින් සභාව වෙත පවරා ඇති බලතල නිසාය.

- පරිසර බලපත්‍ර නිකුත්කිරීමේ බලය
- ගොඩනැගිලි ඉදිරිකිරීම සඳහා අනුමැතිය දීමේ බලය
- ගව ඝාතනාගාර සඳහා බලපත්‍ර දීමේ බලය
- පීඩාවන් ඉවත් කිරීමේ බලය
- ගොඩනැගිලි ඉදිරිම් පරීක්ෂා කිරීමේ බලය
- මහජනයාට අන්තරායකර ගොඩනැගිලි හා ගස් කිරීමේ බලය මේ අතරින් ප්‍රධාන වේ.

## vi. පළාත් පාලන ආයතනයක මහජන සහභාගීත්වය

පළාත් පාලන ආයතන අනෙක් මහජන ආයතනවලට වඩා වැඩි මහජන සහාගීත්වක් අපේක්‍ෂා කරයි. ඒ සදහා වූ සුවිශේෂී ක්‍රමයක් වන්නේ කමිටු ක්‍රමයයි. ඒ අනුව පළාත් පාලන ආයතනයක සභාවට උපදෙස් ලබාදීම සදහා පිහිටුවන කමිටු සදහා සභිකයන්ට අමතරව මහජනතාව සහභාගී කරගැනීමේ අවස්ථාව ඇත.

## vii. පළාත් පාලන සභිකයකුගේ භූමිකාව

පලාත් පාලන ආයතනයකට පැවරෙන ඉහත කී බලතල හා කාර්යයන් ඇසුරෙන් පලාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ භූමිකාව නිර්මාණය වේ. විශේෂයෙන්ම පුරවැසියන්ගේ තිඹිරිගෙය සිට මරණ මංචකය දක්වා වඩාත් සමීප කටයුතු සියල්ල පළාත් පාලන ආයතනයක් හා සම්බන්ධ වේ. එබැවින් සියළු වගකීම් ඉටු කිරීමේදී අදාල පළාත් පාලන බල ප්‍රදේශයේ පදිංචිකරුවන් මෙන්ම එකී පළාත් පාලන ආයතනයට බදු ගෙවන්නන් ගේ අවශ්‍යතා පිළිබදව සැලකිලිමත් විය යුතුය.

විශේෂයෙන්ම ඉදිරියේ පැවත්වෙන ඡන්ද විමසීම් මගින් 60% නියෝජිතයින් කොට්ඨාශ ක්‍රමය මගින් පත්වන නිසා එකී නියෝජිතයන්ට අදාල කොට්ඨාශයේ ප්‍රජාවගේ අවශ්‍යතා පිළිබදව දැඩි ලෙස උනන්දුවක් දක්විය යුතුවේ.

# 12.
# මහජන නියෝජිතයකු තෝරාගැනීම පිළිබඳ උපමාන

පාර්ලිමේන්තුවට පළාත් සභාවට මෙන්ම පළාත් පාලන ආයතනයට මහජන නියෝජිතියකු පත් කරගැනීමේදීද ඡන්ද දායකයන් විසින් දැඩි ලෙස සැලකිලිමත් විය යුතුය. නුසුදුසු පුද්ගලයකු මහජන නියෝජිතයකු ලෙස පත් වුවහොත් ඒ මගින් තමන් ජීවත්වන කොට්ඨාශටයට පමණක් නොව සමස්ථ පළාත් පාලනය ආයතනයට හා පොදුවේ රටටද විශාල හානියක් සිදුවේ.

විශේෂයෙන්ම මෙවර මැතිවරණයේදී කොට්ඨාශයට වගකියන නියෝජිතයකු හිමිවන නිසා සිය නියෝජිතයා කෙරෙහි සැලකිලිමත් වීමේ වැදගත් කම වඩාත් තීව්‍ර වේ.

## i. පක්ෂය විසින් සුදුසු අපේක්ෂයන්ට නාම යෝජනා ලබාදීම

නව පළාත් පාලන මැතිවරණයේදී ඡන්ද දායකයන්ට අපේක්ෂකයන් තෝරාගැනීමට ඇති ඉඩකඩ ඉතාමත් සීමිතය.එයට හේතුව දේශපාලන පක්ෂ මගින් අදාල කොට්ඨාශ සඳහා නම් කර ඇති අපේක්ෂකයින් අතරින් සුදුස්සෙකු තෝරාගැනීම මිස පළාත් පාලන කොට්ඨාශයට නම් කර ඇති අපෙක්ෂකයින් අතරින් අයෙක් තෝරා ගැනීමේ අවස්ථාව මෙවර මැතිවරණයේදී අහිමි වී යයි. එබැවින් සුදුසු පුද්ගලන්ට නාම යෝජනා ලබාදීමේ දේශපාලන පක්ෂ වගකීම වඩාත් ඉස්මතු වේ.

මැතිවරණ සඳහා නාමයෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ විසින් අනුගමණය කල යුතු පොදු නිර්ණායක 8 මාර්තු 12 ව්‍යාපාරය විසින් 2015 වර්ෂයේදී හදුන්වා දුන් අතර ඒ සඳහා සියලුම දේශපාලන පක්ෂ විසින් එකගතාවය දක්වා ඇත.
එම නිර්ණායක නම්

- අපරාධ වරදක් සඳහා සිරදඬුවමට ලක් වූ හෝ අත්හිටවූ සිරදඬුවම් වලට ලක්වූවකු නොවිය යුතුයි
- අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරදකරුවෙකු නොවූ සමාජය පිළිගත් චරිතවත් අයෙකු විය යුතුයි. එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා ලැබූ අයගැන පරීක්ෂාකාරී විය යුතුයි.
- මද්‍යාසාර,මත්ද්‍රව්‍ය,සූදු,කැසිනෝ,ගණිකා මඩම් ඇතුළු රටේ යහපැවැත්මට හානිකර ව්‍යාපාර පවත්වාගෙන යන හෝ අතීතයේ එසේ නොකළ අයෙකු විය යුතුයි.

- ජීව ආධාරක ව්‍යුහය විනාශ කරන පාරිසරික වශයෙන් හානිදායක වන ව්‍යාපාරවල යෙදුණු හෝ යෙදෙන අයෙකු නොවිය යුතුයි.
- දේශපාලන බලය අනිසි ලෙස සහ අයුතු ලෙස භාවිතා නොකළ අයෙකු විය යුතුය.
- මහජන නියෝජිතයකුවන්නට පෙර රටට අගතිගාමී මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් සහ මහජන නියෝජිතයකුව සිටිමින් තම දේශපාලන බලය අයුතු ලෙස භවිතා කර රජය සමග මූල්‍යමය ගිවිසුම් ඇතිකර ගත් හෝ ගිවිසුමක පාර්ශවකරුවෙකු නොවන්නෙකු විය යුතුය.
- නාමයෝජනා ලබාදෙන අපේක්ෂකයා තමා නියෝජනය කරන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු හෝ එම ජනතාව සමග සම්බන්ධතා පවත්වන අයෙකු විය යුතුය.
- නාමයෝජනා ලබා දීමේදී කාන්තා සහ තරුණ නියෝජනය සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබාදීමට ක්‍රියා කළ යුතුයි.

## ii. පුරවැසියන්ට දේශපාලන පක්ෂ කෙරෙහි කල හැකි බලපෑම

ඉහත සඳහන් පොදු නිර්ණායක දේශපාලන පක්ෂ විසින් හුදු ස්වේච්ඡාවෙන්ම අනුගමණය කරනු ඇතැයි උපකල්පනය කිරීම මිත්‍යාවකි. එබැවින් දේශපාලන පක්ෂවලට බලපෑම් සිදු කල යුතුය. එසේ සිදුකල හැකි බලපෑම් අතර

- සුදුසු අපේක්ෂකයන්ට පමණක් නාමයෝජනා ලබාදෙන ලෙස තම පක්ෂයට බලපෑම් කිරීම
- තම පක්ෂය සුදුසු අය ඉදිරිපත් නොකරන්නේ නම් සුදුසු අපේක්ෂකයින් ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂවලට හෝ ස්වාධීන කණ්ඩායම්වලට තම ඡන්දය ලබාදෙන ලෙස තම ප්‍රාදේශිය දේශපාලන නායකත්වය දැනුවත් කිරීම
- දූෂිත පුද්ගලයන්ට නාමයෝජනා ලබාදීමට විරුද්ධ වීම
- තම ගමට සේවය කලහැකි දක්ෂ අවංක පුද්ගලයන් වටා පක්ෂභේදයකින් තොරව පෙළගැසීම
- කාන්තා නියෝජනය වැඩිවීමේ සැබෑ ප්‍රතිඵල ළගාකරගැනීමට දක්ෂ, නිර්මාණශීලි,අවංක කාන්තාවන් ලැයිස්තුවට ඇතුළත් කිරීමට තම නායකත්වයට බලකිරීම

- මරණාධාර සමිති තරුණ සමිති වැනි ගමේ ක්‍රියාත්මක වන සියළු ප්‍රජා සංවිධානවලදී ඉදිරි පළාත් පාලන ඡන්ද විමසීම ගැන කතා කරන්න.පක්ෂ පාට නොසලකා සුදුස්සන් පමණක් ඔබේ ගමේ නායකත්වයට පත් කිරීමට ක්‍රියාකිරීම.
- නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා වගකීම් සහගත පුරවැසියකු ලෙස කලහැකි උපරිම මැදිහත්වීම සිදුකිරීම.
- කාන්තාවන්ට 25% ක අනිවාර්ය නියෝජනය ලැබුණද දක්ෂ හැකියාවක් සහිත කාන්තාවන්ට කොට්ඨාශ සඳහා තරග කිරීමට ඉඩදිය යුතු බවට තම දේශපාලන පක්ෂයට බලපෑම් කිරීම.
- පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට එක්වූ නව සංශෝධන අනුව තරුණ නියෝජනය අනිවාර්ය නොවූවද තරුණයන්ට ප්‍රමාණවත් අවස්ථාවක් ලබාදීමට දේශපාලන පක්ෂයට බලපෑම් කිරීම.

කෙසේ නමුත් ඡන්ද විමසීමේ දිනයේදී තමන් ඡන්දය දෙන්නේ කාටද යන්න පිළිබඳ සාධාරණ තීරණයකට එළඹීම සඳහා මාර්තු 12 ව්‍යාපාරය විසින් හඳුන්වාදී ඇති "ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු-ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු" නැමති ලකුණු සටහන අදාල කරගත හැකිය.

**ඔබේ ඡන්දයට වටිනාකමක් ලබාදෙමු, ඡන්දය දීමට පෙර අපේක්ෂකයන්ට ලකුණු දෙමු.**

| දේශපාලන පක්ෂය/ ස්වාධීන කණ්ඩායම් | ඔබේ කොට්ඨාසයට තරග කරන අපේක්ෂකයන් | සාධාරණ ලෙස මුදල් උපයන්නෙකි | බලය අයුතු ලෙස භාවිතා නොකරන්නෙකි | අල්ලස් හෝ දූෂණ චෝදනා නොලැබූ අයෙකි | ඔබට නිරන්තරයෙන් හමුවිය හැකි සමීප පුද්ගලයෙකි | පරිසරය හානි නොකරන්නෙකි | සමාජ මෙහෙවරට දක්ෂයෙකි | සියළු ජාති, ආගම් සංස්කෘතින්ට ගරු කරන්නෙකි | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

එක් එක් නිර්ණායකයට අදාලව
අපේක්ෂකයා සඳහා ලකුණු ලබාදෙන ක්‍රමය

| | |
|---|---|
| ඉතා හොඳයි | 08 - 10 |
| හොඳයි | 05 - 07 |
| සාමාන්‍යයි | 02 - 04 |
| දුර්වලයි | 00 - 02 |

එක් එක් අපේක්ෂකයාට අදාළව මුළු ලකුණු ගණනය කර වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගන්න

බුද්ධිමත්ව ඡන්දය භාවිතා කරමු. සුදුස්සන් පමණක් ඔබේ පළාත් පාලන ආයතනයට තෝරා ගනිමු.

**මාර්තු 12 ව්‍යාපාරයේ පණිවුඩයකි**

**පෞද්ගලික ප්‍රයෝජනය සඳහා පමණි. සම්පූර්ණ කරන ලද පත්‍රිකා අන් සතු නොකරන්න.**

## අපේක්ෂකයින්ට නාම යෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ සලකා බැලීමට එකඟ වූ පොදු නිර්ණායක

### அரசியல்வாதிகளுக்கு வேட்புமனு வழங்கும் போது கருத்திற்கொள்வதற்கு அரசியல் கட்சிகள் இணங்கிய பொதுவான அளவுகோல்கள்

### COMMON CRITERIA AGREED BY POLITICAL PARTIES TO CONSIDER WHENGIVING NOMINATION

අපරාධ කරුවෙකු නොවන
குற்றவாளியற்ற
SHOULD NOT BE A CRIMINAL

බලය අවභාවිත නොකරන
அதிகாரத்தை பிழையாக பயன்படுத்தாத
NOT ABUSING AUTHORITY

අල්ලස් හෝ දූෂණයෙන් තොර
இலஞ்ச ஊழலில் ஈடுபடாத
FREE OF BRIBERY & CORRUPTION

අසාධු මූල්‍ය ගිවිසුම්වලින් තොර
ஊழல் நிறைந்த நிதி உடன்படிக்கைகளில் ஈடுபடாத
FREE OF ABUSIVE FINANCIAL CONTRACTS

සමාජ විරෝධී ව්‍යාපාරයන්ගෙන් තොර
சமூகத்திற்கு ஒவ்வாத வியாபாரங்களில் ஈடுபடாத
FREE OF ANTI-SOCIAL TRADES

ඡන්දදායකයින්ට සමීප
வாக்காளர்கள் இலகுவில் அணுகக்கூடிய
CLOSE TO ELECTORS

පරිසර හිතකාමී
சுற்றாடலை பேணும்
ENVIRONMENT FRIENDLY

ප්‍රමාණවත් කාන්තා හා තරුණ නියෝජනය
போதுமான பெண்கள் இளைஞர் பிரதிநிதித்துவத்திற்கான
OPPORTUNITIES FOR WOMEN AND YOUTH


පැෆ්රල් ප්‍රකාශන
12/3, රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත,
කොළඹ 06.
දුරකථන - 011 2514441|2
ෆැක්ස් - 011 2514443
ඊමේල් - paffrel@sltnet.lk
වෙබ් අඩවිය - www.paffrel.lk

9 789554 082038